# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,748 - 2012 මාර්තු මස 02 වැනි සිකුරාදා - 2012.03.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 624 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | 632 |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 642 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 මාර්තු මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 පෙබරවාරි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# පළාත් පාලන නිවේදන

## මාවනැල්ල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව සබරගමුව පළාතේ පළාත් සභාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනවල දක්වා ඇති මංමාවත්, මාවනැල්ල ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් විරෝධතා නොතිබුන බැවින් දෙවැනි වරට ප්‍රකාශයට පත් කරන බව මෙයින් නිවේදනය කරන ලදී.

බී. පී. ඉඳුනිල් ශාන්ත ගුණසේන,
සභාපති,
මාවනැල්ල ප්‍රාදේශීය සභාව.

2012 පෙබරවාරි මස 13 වැනි දින,
මාවනැල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය - 1

පාරේ නම : දුටුගැමුණු මාවත
පාරේ ආරම්භය (සිට) අවසානය (දක්වා) : ශ්‍රී අනෝමදස්සී වැඩිහිටි නිවාසය
පාරේ දිග : මීටර් 150,
පාරේ පළල : අඩි 10
ග්‍රාම නිලධාරි කොට්ඨාසය : කප්පාගොඩ

| | වම්පස | | දකුණුපස | |
|---|---|---|---|---|
| | ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම | ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම |
| 1. | බී. ඒ. ලක්ෂ්මන් | කඩවක වත්ත | කේ. එම්. චමින්ද රෝහන | කඩවක වත්ත |
| 2. | බී. ඒ. ඒ. කේ. රාජපක්ෂ | කඩවක වත්ත | ඩික්ෂන් රාජමන්ත්‍රී | කඩවක වත්ත |
| 3. | එම්.පී. විමල් ජේ. කුලතුංග | කඩවක වත්ත | චන්ද්‍රාවතී මැණිකේ | කඩවක වත්ත |

### උපලේඛනය - 2

පාරේ නම : මීපිටිවල සිට මාකෙහෙල්වල දුම්රිය ස්ථානයට යන පාර
පාරේ ආරම්භය (සිට) අවසානය (දක්වා) : මීපිටිවල සිට මාකෙහෙල්වල දුම්රිය ස්ථානයට යන පාර
පාරේ දිග : කි මී. 02
පාරේ පළල : අඩි 06
ග්‍රාම නිලධාරි කොට්ඨාසය : දුනුගම/මාලියද්ද

| | වම්පස | | දකුණු පස | |
|---|---|---|---|---|
| | ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම | ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම |
| 1. | එම්. ඩී. මේරිනෝනා | ගනහේන වත්ත | එම්. ඩී. මේරිනෝනා | ගල් ඇන්ද හේන |
| 2. | එම්. පී. ආරියරත්න | ගනහේන වත්ත | එම්. පී. ආරියරත්න | ගල් ඇන්ද හේන |
| 3. | ආර්. පී. සුජීව පුෂ්ප කුමාර | දිගන වත්ත | ආර්. පී. සුජීව පුෂ්ප කුමාර | දිගන වත්ත |
| 4. | ආර්. පී. විජේසේකර | දිගන වත්ත | ආර්. පී. විජේසේකර | දිගන වත්ත |
| 5. | ආර්. පී. ගුණදාස | දිගන වත්ත | ආර්. පී. ගුණදාස | දිගන වත්ත |
| 6. | ආර්. පී. එන්. ටී. විජේකුලසූරිය | දිගනවත්ත | ආර්. පී. එන්. ටී. විජේකුලසූරිය | දිගන වත්ත |
| 7. | උපාලි ඒකනායක | දිගන වත්ත | උපාලි ඒකනායක | දිගන වත්ත |
| 8. | ආර්. පී. සරත් විජේතුංග | අගලමුල්ල හේන | ආර්. පී. සරත් විජේතුංග | අගලමුල්ල හේන |

### උපලේඛනය - 3

පාරේ නම : ශ්‍රී නාගින්ද්‍රාරාම විහාර මාවත
පාරේ ආරම්භය (සිට) අවසානය (දක්වා) : පෙතිගම්මන වීමල වත්ත සිට කිරිකොහොමුල්ල හරහා නාගින්ද්‍රාරාම විහාරස්ථානය දක්වා
පාරේ දිග : අඩි 560
පාරේ පළල : අඩි 08
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :- 38, පල්ලිපෝරුව

| වම්පස | | දකුණුපස | |
|---|---|---|---|
| ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම | ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම |
| 1. ඩබ්. තිලකරත්න | තිබ්බට්ටේවත්ත | ජී. එස්. මැණික්ගේ | තිබ්බට්ටේවත්ත |
| 2. ජී. ඩී. සුගතදාස | එම | ඩබ්. අනිල් සමරසූරිය | තිරිතොහොටුල්ල |
| 3. ජී. ඩී. ස්වර්ණලතා | එම | ජී. ඩී. සුනිල් ශාන්ත | එම |
| 4. ඩබ්. ඒ. සමන්ත තිලකරත්න | කිරිකොහොමුල්ල | ජී. වී. උපාලි ප්‍රේමතිලක | එම |
| 5. ජී. ලාල් විජේසේකර | කිරිකොහොමුල්ල | යූ. ජී. කුසුමාවතී | එම |

උපලේඛනය - 4

| | | |
|---|---|---|
| පාරේ නම | : | අංවාරම සිට බොලගම පාරේ සිට අතුරු පාර |
| පාරේ ආරම්භය (සිට) අවසානය (දක්වා) | : | බොලගම පාරේ අංක 57 ඉඩමේ සිට අංක 54 ඉඩම දක්වා |
| පාරේ දිග | : | අඩි 250 |
| පාරේ පළල | : | අඩි 12 |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : | 20 බී කෝන්දෙනිය |

| වම්පස | | දකුණුපස | |
|---|---|---|---|
| ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම | ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම |
| 1. ආර්. එම්. ලාල් චන්ද්‍රසිරි | අංක 56 ඉඩම | ආර්. එම්. ජයතිලක බණ්ඩා | අංක 56 ඉඩම |
| 2. ඩබ්. ඒ. සිරිශාන්ත වික්‍රමසිංහ | අංක 54 ඉඩම | එම්. එන්. ආරියරත්න | අංක 53 ඉඩම |
| 3. බී. එම්. ෂෙල්ටන් රත්නායක | අංක 56 ඉඩම | ආර්. එම්. ගුණතිලක | අංක 56 ඉඩම |

උපලේඛනය - 5

| | | |
|---|---|---|
| පාරේ නම | : | හරංකහව කන්ද පාර |
| පාරේ ආරම්භය (සිට) අවසානය (දක්වා) | : | 350 මී. |
| පාරේ දිග | : | මීටර් 350 |
| පාරේ පළල : | : | අඩි 08 |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : | 36ඒ කැකිරිගොඩ |

| වම්පස | | දකුණුපස | |
|---|---|---|---|
| ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම | ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම |
| 1. කේ. ජෝන් කටුලන්ද | කටුලන්ද හේන | ඒ. එම්. එස්. අත්තනායක | කටුලන්ද හේන |
| 2. කේ. පබිලිස් | කටුලන්ද හේන | ඒ. එම්. චමින්ද රොෂාන් | කටුලන්ද හේන |
| 3. ඊ. එම්. උපනන්ද | පුස්සමුල්ල හේන | | |

උපලේඛනය - 6

| | | |
|---|---|---|
| පාරේ නම | : | හීන්කෙන්ද ගහමුල හේන වත්ත නොහොත් යටියෑතැන්න වත්ත පාර |
| පාරේ ආරම්භය (සිට) අවසානය (දක්වා) | : | යටියෑව මාර්ගයේ සිට හීන්කෙන්ද ගහමුල හේන වත්ත දක්වා |
| පාරේ දිග | : | අඩි 285 |
| පාරේ පළල | : | අඩි 08 |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : | රන්දිවල |

| වම්පස | | දකුණුපස | |
|---|---|---|---|
| ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම | ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම |
| 1. ඒ. එම්. ආර්. උපුල් සමරකෝන් | හීන්කෙන්දගහමුල හේන වත්ත නොහොත් යටියෑතැන්න වත්ත | ඒ. එම්. ආර්. උපුල් අබේරත්න | හීන්කෙන්දගහමුල හේන වත්ත නොහොත් යටියෑ තැන්න වත්ත |

| වම්පස | | දකුණුපස | |
|---|---|---|---|
| ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම | ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම |
| 2. කේ. ආර්. දිසානායක | හීන්කෙන්දගහමුලහේනවත්ත නොහොත් යටියෑතැන්න වත්ත | ඒ. එම්. ආර්. උපුල් අබේරත්න | හීන්කෙන්ද ගහමුල හේනවත්ත නොහොත් යටියෑතැන්නවත්ත |
| 3. කේ. ආර්. පී. වීරසිංහ | එම | | |
| 4. කේ. ආර්. පොඩි බණ්ඩා | එම | | |
| 5. කේ. ආර්. සමරසිංහ | එම | | |
| 6. කේ. ආර්. සිසිර සම්පත් | එම | | |
| 7. කේ. ආර්. චන්ද්‍රාවතී | එම | | |
| 8. කේ. ඩී. ඒ. නිෂාන් සත්‍යජිත් | එම | | |
| 9. කේ. ආර්. ප්‍රදීප් අබේරත්න | එම | | |

**උපලේඛනය - 7**

| | | |
|---|---|---|
| පාරේ නම | : | පල්ලේ වත්ත පාර |
| පාරේ ආරම්භය (සිට) අවසානය (දක්වා) | : | කැකිරිගොඩ පාරේ සිට පල්ලේවත්ත දක්වා |
| පාරේ දිග | : | මීටර් 300 |
| පාරේ පළල | : | අඩි 08 |
| ග්‍රාම නිලධාරි කොට්ඨාසය | : | 28, ඒ. කැකිරිගොඩ |

| වම්පස | | දකුණු පස | |
|---|---|---|---|
| ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම | ඉඩම් හිමියන්ගේ නම් | ඉඩමේ නම |
| 1. ඩබ්. එම්. බිසෝමැණිකේ | පල්ලේවත්ත | ඒ. ජී. සෙනෙවිරත්න | පල්ලේවත්ත |
| 2. බී. සී. ප්‍රබෝධනී | පල්ලේවත්ත | එම්. එම්. මැණිකේ | පල්ලේවත්ත |
| 3. ඒ. ජී. සමන් කුමාර | පල්ලේවත්ත | ඒ. ඩබ්. කුසුමාවතී | පල්ලේවත්ත |
| 4. ඒ. ජී. කුසුමාවතී | පල්ලේවත්ත | එච්. ජී. පුංචි බණ්ඩා | පල්ලේවත්ත |
| 5. ඒ. ජී. කරුණාතිලක | පල්ලේවත්ත | එච්. ජී. සමීර | පල්ලේවත්ත |
| 6. එල්. ආර්. සෙනෙවිරත්න | පල්ලේවත්ත | ඒ. ජී. ආනන්ද | පල්ලේවත්ත |
| 7. බී. රේණුකා | පල්ලේවත්ත | ඒ. ජී. ටිකිරි බණ්ඩා | පල්ලේවත්ත |
| 8. ඒ. ජී. ටිකිරි බණ්ඩා | පල්ලේවත්ත | ඒ. වී. ශ්‍යාමලි පුෂ්පා | පල්ලේවත්ත |
| | | එම්. ඩී. විජිත කුමාරතුංග | පල්ලේවත්ත |

03-268

---

**බේරුවල ප්‍රාදේශීය සභාව - අළුත්ගම**

මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ පයාගල උප කාර්යාල බලප්‍රදේශයට අයත්, කරඳගොඩ මහගෙදරවත්ත හරහා බුබුලලන්ද ස්ටෝරුව අසල ප්‍රධාන මාර්ගයට සම්ප්‍රාප්ත වන ස්ථානය දක්වා පාර "පීරිස් හාල්පන්දෙනිය මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2007.12.18 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ අංක 5:1:2 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, ඉහත සඳහන් පාර "පීරිස් හාල්පන්දෙනිය මාවත" යනුවෙන් 2010.03.22 වැනි දින සිට නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2012 පෙබරවාරි මස 02 වැනි දින,
අළුත්ගම,
බේරුවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

03-203/3

**බේරුවල ප්‍රාදේශීය සභාව**

මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ පයාගල උප කාර්යාල බල ප්‍රදේශයට අයත් පයාගල කච්චාගොඩ මාර්ගය "රණවිරු චන්ද්‍රසිරි අමන්දකෝන් මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2009.07.21 වැනි දින පැවැති මාසික සභා රැස්වීමේ අංක 5:1:6 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, ඉහත සඳහන් පාර "රණවිරු චන්ද්‍රසිරි අමන්දකෝන් මාවත" යනුවෙන් 2010.03.22 වැනි දින සිට නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2012 පෙබරවාරි මස 02 වැනි දින,
අළුත්ගම,
බේරුවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

03-203/1

---

**බේරුවල ප්‍රාදේශීය සභාව - අළුත්ගම**

මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ මාලේබන්බද්ද උප කාර්යාල බල ප්‍රදේශයට අයත් පන්නිල වෙදගොඩ වලතර මාර්ගය "රණවිරු මිගාර චන්ද්‍රසිරි මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2009.08.18 වැනි දින පැවැති මාසික සභා රැස්වීමේ අංක 5:1:5 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, ඉහත සඳහන් පාර "රණවිරු මිගාර චන්ද්‍රසිරි මාවත" යනුවෙන් 2010.03.22 වැනි දින සිට නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2012 පෙබරවාරි මස 02 වැනි දින,
අළුත්ගම,
බේරුවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

03-203/2

---

**බේරුවල ප්‍රාදේශීය සභාව - අළුත්ගම**

මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ මාලේවන්බද්ද උප කාර්යාල බල ප්‍රදේශයට අයත් ගල්හේන හන්දියේ සිට හෙට්ටිමුල්ල දක්වා දිවෙන මාර්ගය "රණවිරු සිංහාර රංජිත් මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2009.07.21 වැනි දින පැවැති මාසික සභා රැස්වීමේ අංක 5:1:2 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, ඉහත සඳහන් පාර "රණවිරු සිංහාර රංජිත් මාවත" යනුවෙන් 2010.03.22 වැනි දින සිට නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2012 පෙබරවාරි මස 02 වැනි දින,
අළුත්ගම,
බේරුවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

03-203/7

## බේරුවල ප්‍රාදේශීය සභාව - අළුත්ගම

### මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ පයාගල උප කාර්යාල බලප්‍රදේශයට අයත් යොවුන්ගම සමුපකාරය පිටුපසින් වමට ඇති මාර්ගය "එස්. එන්. සරත් රණවිරු මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2009.03.17 වැනි දින පැවැති මාසික සභා රැස්වීමේ අංක 5:3:1 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, ඉහත සඳහන් පාර "එස්. එන්. සරත් රණවිරු මාවත" යනුවෙන් 2010.03.22 වැනි දින සිට නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2012 පෙබරවාරි මස 02 වැනි දින,
අළුත්ගම,
බේරුවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

03-203/6

---

## බේරුවල ප්‍රාදේශීය සභාව - අළුත්ගම

### මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ පයාගල උප කාර්යාල බල ප්‍රදේශයට අයත් මග්ගොන ශාන්ත විසෙන්ති මාවතට සම්බන්ධ කුඹුරුගොඩ සිට කුමාරකන්ද දක්වා දිවෙන මාර්ගයට යාවී ඇති මීටර් 100කින් සමන්විත අතුරු මාර්ගය "ශ්‍රී සුමනනන්ද මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2008.09.16 වැනි දින පැවැති මාසික සභා රැස්වීමේ අංක 5:1:2 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, ඉහත සඳහන් පාර "ශ්‍රී සුමනනන්ද මාවත" යනුවෙන් 2010.03.22 වැනි දින සිට නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2012 පෙබරවාරි මස 02 වැනි දින,
අළුත්ගම,
බේරුවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

03-203/5

---

## බේරුවල ප්‍රාදේශීය සභාව - අළුත්ගම

### මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ පයාගල උප කාර්යාල බල ප්‍රදේශයට අයත් මග්ගොන මුංහේන පාරේ අළුත් මාවත යනුවෙන් නම් කර ඇති මාර්ගය "රණවිරු අනුර ප්‍රනාන්දු මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2009.07.21 වැනි දින පැවැති මාසික සභා රැස්වීමේ අංක 5:1:3 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, ඉහත සඳහන් පාර "රණවිරු අනුර ප්‍රනාන්දු මාවත" යනුවෙන් 2010.03.22 වැනි දින සිට නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2012 පෙබරවාරි මස 02 වැනි දින,
අළුත්ගම,
බේරුවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

03-203/4

**බේරුවල ප්‍රාදේශීය සභාව - අළුත්ගම**

මාර්ගවල නම් වෙනස් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 198 වගන්තිය අනුව මෙම ප්‍රාදේශීය සභාවේ පයාගල උප කාර්යාල බලප්‍රදේශයට අයත් මග්ගොන නිග්‍රෝධාරාම විහාරස්ථානයට යන පාර "නිග්‍රෝධාරාම මාවත" යන නමින් භාවිතා කිරීම සඳහා මෙම ප්‍රාදේශීය සභාවේ 2005.05.21 වැනි දින පැවැති මාසික සභා රැස්වීමේ අංක 5:12:27 දරන යෝජනාව පරිදි බස්නාහිර පළාත් සභාවේ, පළාත් පාලන විෂයභාර ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලැබී ඇති බැවින්, ඉහත සඳහන් පාර "නිග්‍රෝධාරාම මාවත" යනුවෙන් 2003.04.01 වැනි දින සිට නම් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

ඕ. ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව,
සභාපති,
බේරුවල ප්‍රාදේශීය සභාව,
අළුත්ගම.

2012 පෙබරවාරි මස 02 වැනි දින,
අළුත්ගම,
බේරුවල ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

03-203/8

---

**අරණායක ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 14 හා 24(2) වැනි වගන්ති යටතේ කරන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ අරණායක ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අරණායක ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට ප්‍රාදේශීය සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාල ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් යම් විරුද්ධත්වයක් පලකරනු ලබන්නේ නම් මේ නිවේදනයේ දින සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආර්. දිනේෂ් ගුණරත්න,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
අරණායක.

2012 පෙබරවාරි මස 12 වැනි දින,
අරණායක ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

මාර්ගයේ නම - හත්ගම්පල පාසල් පාරේ සිට කටුපැලැල්ලමුල්ල පාරට වැටෙන කිතුල්වතුපිටි පාර
මාර්ගය ආරම්භය - හත්ගම්පල බටහිර මාර්ගයේ සිට කටුපැලැල්ලමුල්ල පාර දක්වා ග්‍රාම නිලධාරි වසම අංක 47 හත්ගම්පල
මාර්ගයේ දුර - දම්වැල් 6 පළල අඩි 08

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා දකුණුපස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

1. ඒ. ජී. කරුණාවතී - ගොඩහලහ
2. එන්. එම්. විල්සන් වීරරත්න - ගොඩහලහ
3. ඒ. ජී. පොඩිරාළහාමි - කිතුල්වතුපිටිවල කුඹුර
4. ඒ. ජී. කිරිබංඩා - කිතුල්වතුපිටි කනටි

*මාර්ගය ආරම්භයේ සිට අවසානය දක්වා වම් පස ඉඩම් හිමියන්ගේ නම් සහ ඉඩමේ නම :*

1. එච්. ඒ. පොඩි මැණිකේ - කිතුල්වතුපිටි කුඹුර
2. ඒ. වී. පියල් රංජිත් - කිතුල්වතුපිටි කුඹුර
3. ඒ. ජී. පොඩි රාළහාමි - කිතුල්වතුපිටි කුඹුර
4. ඒ. ජී. කිරිබණ්ඩා - කිතුල්වතුපිටි කනටි
5. ඒ. ජී. ටිකිරි බණ්ඩා - කිතුල්වතුපිටි අස්සැද්දුම

03-15

**කළුතර නගර සභාව**

*255 වැනි අධිකාරය නගර සභා ආඥාපනතේ 55(අ) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම*

255 වැනි අධිකාරය නගර සභා ආඥා පනතේ 55(අ) වගන්තිය ප්‍රකාර, බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කයේ කළුතර නගර සභාව විසින් කළුතර උතුර දෙවැනි හරස් වීදිය පාර, "අබේසේකර මාවත" යනුවෙන් නම් කිරීමට මහ සභාව විසින් තීරණය කර ඇත.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත්වලට අදාල ඉඩම් හිමිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම්, මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට දින 14ක් ඇතුළත යම් විරෝධතා ඔප්පු කිරීම සඳහා ආඥා පනතේ 55(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත්, ඉහත සඳහන් මාර්ගය කළුතර නගර සභාව විසින් යෝජිත නමින් නම් කිරීමට පිළිගෙන ක්‍රියාකරනු ලබන බව පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

දේශකීර්ති එම් . එම්. එම්. ජවුෆර්,
සභාපති,
කළුතර නගර සභාව.

03-92

---

**මැදදුම්බර ප්‍රාදේශීය සභාව**

ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ දී එළ හරක් මස් වෙළඳාම සඳහා කඩයක් පවත්වාගෙන යාම පිණිස 2012.01.01 සිට 2012.12.31 වැනි දින දක්වා වූ කාලයට බලපත්‍ර ඉල්ලුම් කර ඇති බැවින්, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම පිළිබඳව මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම් කුමන කරුණක් නිසා ද, යන වග පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝසාතක ආඥා පනතේ (272 වැනි අධිකාරය) 7(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ජී. ආර්. එස්. පී. ගමගේ ජයරත්න,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 30 වැනි දින,
තෙල්දෙණිය,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *ඉල්ලුම්කරුගේ නම* | *මස් වෙළඳාම කරනු ලබන ස්ථානය* | *ස්වභාවය* |
|---|---|---|
| එච්. එම්. ෆාරුක් මයා | අංක 70/ඒ, අඹගහලන්ද, තෙල්දෙණිය | එළහරක් මස් වෙළඳාම |
| එස්. ඒ. එම්. අවුෆර් මයා | තෙල්දෙනිය මස් වෙළඳසැළ | එළ හරක් මස් වෙළඳාම |

03-213/1

---

**මැදදුම්බර ප්‍රාදේශීය සභාව**

ගෝසාතක ආඥාපනත (272 වැනි අධිකාරය)

මෙහි පහත උපලේඛනයේ සඳහන් අය විසින් එම උපලේඛනයේ සඳහන් ස්ථානයේ දී මස් පිණිස එළ හරක් ඝාතනය කිරීමේ ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම පිණිස 2012.01.01 දින සිට 2012.12.31 වැනි දින දක්වා වූ කාලයට බලපත්‍ර ඉල්ලුම් කර ඇති, ඒ අනුව බලපත්‍රයක් නිකුත් කිරීම පිළිබඳව මැදදුම්බර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පදිංචි යම් අයෙකු විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණක් නිසා ද යන වග පිටපත් දෙකකින් යුක්තව ලියවිල්ලක් මගින් මෙම දැන්වීම *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට දින 14ක් ඇතුළත මා වෙත ඉදිරිපත් කළ යුතු බව ගෝඝාතක ආඥාපනතේ (272 වැනි අධිකාරිය) 7(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ජී. ආර්. එස්. පී. ගමගේ ජයරත්න,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

*උපලේඛනය*

| *ඉල්ලුම්කරුගේ නම* | *ගෝඝාතනය කරන ස්ථානය* | *ස්වභාවය* |
|---|---|---|
| එච්. එම්. ෆාරුක් මයා<br>අඹගහලන්ද, තෙල්දෙණිය. | අංක 70/ඒ, අඹගහලන්ද, තෙල්දෙණිය | එළහරක් මස් ඝාතනය |

03-213/2

### මැදදුම්බර ප්‍රාදේශීය සභාව

1975 අංක 17 සහ 1987 අංක 38 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධිත) පනත යටතේ කරනු ලබන දැන්වීම - 2012

මෙහි පහත උපලේඛනයේ නම සඳහන් තැනැත්තා විසින් එම නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 1975 අංක 17, 1988 අංක 38 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධිත) පනතේ 6 වැනි වගන්තිය යටතේ 2012 වර්ෂයට බලපත්‍ර ලබාදීමට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාව අසල හෝ එකී සමාජශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු විසින් එම සමාජශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම්, මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 04ක් ඇතුළත යම් විරුද්ධත්වයකට හේතු ලියවිල්ලක් මගින් දක්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

ජී. ආර්. එස්. පී. ගමගේ ජයරත්න,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 30 වැනි දින,
තෙල්දෙණිය,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *ඉල්ලුම්කරුගේ නම* | *සමාජශාලාවේ ලේකම් ද කළමනාකරුද යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාව පවත්වාගෙන යාමට බලාපොරොත්තුවන ස්ථානය* |
|---|---|---|---|
| එරල් ජොන්ස්ටන් ක්‍රිස් හොලවේ | සාමාන්‍යාධිකාරී | වික්ටෝරියා ගොල්ෆ් ක්‍රීඩා සමාජශාලාව | මාබේරියතැන්න වත්ත, රජවැල්ල, හොල්ඩින් සමාගම. |

03-213/3

---

### මැදදුම්බර ප්‍රාදේශීය සභාව

1975 අංක 17 සහ 1987 අංක 38 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධිත) පනත යටතේ කරනු ලබන දැන්වීම - 2012

මෙහි පහත උපලේඛනයේ සඳහන් තැනැත්තා විසින් එම නම ඉදිරියෙන් දැක්වෙන සමාජශාලාව එහි සඳහන් ස්ථානයෙහි පැවැත්වීම සඳහා 1975 අංක 17 1988 අංක 38 දරන සමාජ ශාලාවලට බලපත්‍ර දීමේ (සංශෝධිත) පනෙත් 6 වැනි වගන්තිය යටතේ 2012 වර්ෂයට බලපත්‍ර ලබාදීමට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී සමාජශාලාව අසල හෝ එකී සමාජශාලාව සඳහා අපේක්ෂිත ස්ථානය අසල පදිංචි යම් තැනැත්තෙකු විසින් එම සමාජශාලාව සඳහා බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධ වන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 04ක් ඇතුළත යම් විරුද්ධත්වයකට හේතු ලියවිල්ලක් දක්වමින් පිටපත් දෙකකින් යුතුව මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් දන්වා සිටිනු ලැබේ.

ජී. ආර්. එස්. පී. ගමගේ ජයරත්න,
සභාපති,
මැදදුම්බර ප්‍රාදේශීය සභාව.

2011 නොවැම්බර් මස 30 වැනි දින,
තෙල්දෙණිය,
මැදදුම්බර ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| *ඉල්ලුම්කරුගේ නම* | *සමාජශාලාවේ ලේකම්ද කළමනාකරුද යන වග* | *සමාජශාලාවේ නම* | *සමාජශාලාව පවත්වාගෙන යාමට බලාපොරොත්තුවන ස්ථානය* |
|---|---|---|---|
| එරල් ජොන්ස්ටන් ක්‍රිස් හොලවේ | සාමාන්‍යාධිකාරී | වික්ටෝරියා ගොල්ෆ් ක්‍රීඩා සමාජශාලාව | මාබේරියතැන්න වත්ත, රජවැල්ල, හෝල්ඩිංග්ස් සමාගම |

03-205

# අතුරු ව්‍යවස්ථා

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වැනි අධිකාරය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 03 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් 2011 සැප්තැම්බර් මස 26 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. වී. සුසන්ත පෙරේරා,
සභාපති,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

2012 පෙබරවාරි මස 09 වැනි දින,
වෙන්නප්පුවේ දී ය.

### යෝජනාව

*යෝජනා අංක 16(2) - සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිබඳ*

1989 අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරිය වන 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ වයඹ පළාතේ, පළාත් සභාවේ පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2010.07.16 දින අංක 1663 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ IV(අ) කොටසේ පළ කරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද්දාවූ ද ප්‍රාදේශීය සභාවල -

(i) අප්‍රසන්න අන්තරාදායක සහ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු,

(ii) සංචාරක වෙළඳාම සම්බන්ධ,

(iii) ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම,

(iv) ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම,

(v) ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම,

(vi) ලැගුම් නිවාස හා නවාතැන් පොළවල්,

පිළිබඳ සම්මත අතුරු ව්‍යවස්ථා මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට, පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.

*අප්‍රසන්න, අන්තරාදායක සහ අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම් කටයුතු පිළිබඳ අතුරු ව්‍යවස්ථාව*

1. මෙහි "අප්‍රසන්න, අන්තරාදායක හා අප්‍රසන්න හා අන්තරාදායක වෙළඳාම්" යන්න සභාවේ යෝජනා සම්මුතියකින් නිශ්චිතව සඳහන් කර ඇති මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමුවන උපලේඛනයේ ඇතුළත් කරනු ලබන වෙළඳාම් අදහස් කෙරේ.

2. ඉහත පළමුවන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කරනු ලබන ව්‍යාපාර විධිමත් කිරීම, අධීක්ෂණය කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

3. සභාපතිවරයා විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් දරන්නකු වේ නම් මිස, කිසිම තැනැත්තෙකු ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අප්‍රසන්න ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාරයක් හෝ පවත්වාගෙන යාම නොකළ යුතුය.

4. (i) ව්‍යාපාරය පවත්වාගෙන යනු ලබන පරිශ්‍රය, ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයකු විසින් ඒ සඳහා සුදුසු බවට නිර්දේශ කරන ලද්දේ නම් මිස, සහ

(ii) එම පරිශ්‍රය සහ එම ව්‍යාපාරයේ කාර්යය සඳහා භාවිතයට ගනු ලබන යම් ගොඩනැගිල්ලක් වේ නම්, එම ගොඩනැගිල්ල, පහත සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස, කිසිදු තැනැත්තෙක් අප්‍රසන්න ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීමට හිමිකමක් නොලබන්නේ ය.

*(අ)* පරිශ්‍රය මනා තත්වයකින් පවත්වාගෙන යාමට නඩත්තු කළයුතු අතර, මනා වාතාශ්‍රයක් හා ආලෝකයක් ලැබෙන පරිදි සකස් කර තිබිය යුතුය. සෑම කාමරයකම, විවෘත කළ විට ගෙබිමේ ප්‍රමාණයෙන් පහළොවෙන් පංගුවකට නොඅඩු ප්‍රමාණයේ ජනෙල් සවිකර තිබිය යුතුය.

*(ආ)* සෑම කාමරයකම බිත්තිවල සෑම කොටසක උස මීටර් 2.14 ට නොඅඩු විය යුතු අතර, ගඩොල්, කළුගල්, කබොක් හෝ සිමෙන්ති ගල්වලින් සාදා තිබිය යුතුය. බිත්තිවල ඇතුල් පැති අවම වශයෙන් ගෙබිමේ සිට මීටර් 2 ක් උසට සිමෙන්ති බදාම යොදා කපරාරුකොට තිබිය යුතු අතර, ඉතිරි කොටස හුණු බදාම යොදා කපරාරුකොට හුණු ගා තිබීම ප්‍රමාණවත් වේ.

*(ඇ)* සෑම පියසි කෙළවරක්ම ගෙබිමේ සිට මීටර් 2 ට වැඩි උසකින් තිබිය යුතුය.

*(ඈ)* වහළය යම් ස්ථිර ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

*(ඉ)* දැවමය කොටස් සියල්ල තෙල් සායම් ගා හෝ තීන්ත ආලේප කර තිබිය යුතුය.

*(ඊ)* සම්පූර්ණ ගෙබිම සිමෙන්තියෙන් හෝ ජලය කාන්දු නොවන ද්‍රව්‍යයකින් තනවා තිබිය යුතුය.

*(උ)* පරිශ්‍රය ප්‍රමාණවත් ජල ප්‍රවාහනයක් සිදුවන පරිදි ඉදිකර තිබිය යුතුය.

*(ඌ)* පරිශ්‍රයෙහි සනීපාරක්ෂක කසළ භාජන සහ ප්‍රමාණවත් වැසිකිලි පහසුකම් සපයා තිබිය යුතුය.

*(එ)* පරිශ්‍රයේ ගොඩනැගිලි ඇතුළත විදුලි පහසුකම් සම්බන්ධව විදුලි අධිකාරිවරයෙකු හෝ ඒ පිළිබඳ වෘත්තීය පුහුණුවක් ලත් කාර්මික නිලධාරියෙකු හෝ සභාපති විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් අනුමත කර තිබිය යුතුය.

5. මෙම අතුරු ව්‍යවස්ථාවේ 3 වන ඡේදය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අදාළ වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දිනයෙන් අවසන් විය යුතුය. එසේ වුවද, මෙම අතුරු ව්‍යවස්ථාවේ ව්‍යාපාරය පවත්වාගෙන යාමට පනවා ඇති කවර කොන්දේසියක් හෝ උල්ලංඝනය කරන ලද්දේ නම් බලපත්‍රය අවලංගු කිරීමට සභාපතිවරයාට හිමිකම ඇත්තේ ය. මෙම හිමිකම භාවිතා කිරීමට පෙර අදාළ බලපත්‍රධාරියාට එකී කාරණය සම්බන්ධව කරුණු දැක්වීමට ප්‍රමාණවත් අවස්ථාවක් ලබා දිය යුතුය.

6. (i) සෑම බලපත්‍රධාරියෙකුම ව්‍යාපාරය කරගෙන යාම සඳහා අවශ්‍යවන සියලු ද්‍රව්‍ය දුගඳ හැමීම හෝ වෙනත් පීඩාවක් ඇතිවීම වැළැක්වෙන පරිදි ගබඩා කර තැබිය යුතුය.

(ii) පීඩා ඇතිවීමට හෝ දුගඳ හැමීමට ඉඩ ඇති ද්‍රව්‍ය පොදු ස්ථානයක හෝ මංමාවතක් ඔස්සේ රැගෙන යාමේදී, කිසිදු පීඩාවක් ඇතිවීම වැළැක්විය හැකිවන සේ ආවරණය කරන ලද, උරා නොගන්නා භාජනවල දමා රැගෙන යා යුතුය.

(iii) යම්කිසි නිෂ්පාදන ක්‍රියාවලියක දී විමෝචනය වන පීඩාකාරී වාෂ්ප හෝ වායු, ඒවා විහිදී හානිකර හෝ පීඩාකාරී ප්‍රතිඵල හට ගැනීමට ඉඩ නොලැබෙන ආකාරයකින් හා උසකින් වායුගෝලයට මුදා හැරීම කළ යුතුය. නැතහොත් ගින්දර හෝ ඝණීකරණ උපකරණයක් තුළින් පිටවීමට සැලැස්විය යුතුය.

(iv) තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ප්‍රමාණවත් කාණු තනවා මැනවින් නඩත්තු කළ යුතු අතර, ඒවා දිනපතා සේදීම කළ යුතුය.

(v) තම ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි ගෙබිම ජලය කාන්දු නොවන යම් ද්‍රව්‍යයකින් ඉදිකරවිය යුතු අතර, හොඳින් නඩත්තු කිරීමත්, දිනපතා ශුද්ධ පවිත්‍ර කිරීමත් කළ යුතුය.

(vi) ව්‍යාපාරය කරගෙන යනු ලබන ගොඩනැගිලිවල බිත්ති අපවිත්‍ර දෑ උරාගැනීමෙන් ආරක්ෂා වන පරිදි යහපත් තත්වයකින් තබාගත යුතු අතර, වාර්ෂිකව ඒවායේ තීන්ත ආලේප කළ යුතුය.

(vii) ව්‍යාපාරික කටයුතු වලදී භාවිතා කරනු ලබන උපකරණ හා භාජන ඇතුළු සියල්ල පිරිසිදුව තැබිය යුතු අතර, දිනපතා පිරිසිදු කළ යුතුය.

(viii) ව්‍යාපාරය කරගෙන යනු ලබන පරිශ්‍රයෙහි කසළ, අතුගා එකතු කරනු ලබන බොල්, රොඩු සමග අපතේ ගිය ද්‍රව්‍ය හා අතුරු නිෂ්පාදන, ඒවා තව දුරටත් ව්‍යාපාර කටයුතුවලට වහාම යොදවන්නේ නම් මිස, ආවරණය කරන ලද භාජනවල බහා දිනපතා ඉවත් කළ යුතුය.

(ix) හම් හෝ වෙනත් ද්‍රව්‍යයක් සේදීම හෝ පෙඟවීම සඳහා භාවිතා කරනු ලබන ටැංකි දුගඳ හැමීම වැළැක්වීම සඳහා අවශ්‍යවන පරිදි හිස් කර පවිත්‍ර කළ යුතුය.

(x) යම් ගංගාවක්, දිය පාරක්, ඇලක්, සොරොව්වක්, ළිඳක්, වැවක් හෝ යම් කාණුවක්, මුහුදක් හෝ යම් විවෘත ජල ප්‍රදේශයක් තුළ යම් අපවිත්‍ර, දුගඳ හමන හෝ අප්‍රසන්න ජලය හෝ වෙනත් දියරයක් යැවීමෙන් හෝ ඒ තුළට ගලායාමට සැලැස්වීමෙන් හෝ අප්‍රසන්න ද්‍රව්‍යයක් සේදීමෙන් හෝ වෙනත් ආකාරයකින් හෝ එවැනි ගංගාවක්, දියපාරක්, ඇළක්, සොරොව්වක්, ළිඳක්, වැවක්, මුහුදක් හෝ විවෘත ජල ප්‍රදේශයක් අපවිත්‍ර කිරීම නොකළ යුතුය.

7. සභාපතිවරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් හෝ බලය පවරන ලද ප්‍රාදේශීය සභාවේ යම් නිලධරයකු විසින් සියළු සාධාරණ වේලාවන් තුළදී, අප්‍රසන්න ව්‍යාපාරයක් හෝ අන්තරාදායක ව්‍යාපාරයක් හෝ කරගෙන යනු ලබන පරිශ්‍රයකට ඇතුළු වී පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේ ය. තවද, බලපත්‍රලාභියා හෝ එහි පාලනය භාර තැනැත්තා හෝ එවැනි පරීක්ෂණයක් කිරීම සඳහා ඉඩදිය යුතු වන්නේ ය.

8. බලපත්‍රලත් පරිශ්‍රයක්, මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් විධිවිධානවලට අනුකූල නොවන බව පරීක්ෂණයකදී අනාවරණය වූ අවස්ථාවක, යථෝක්ත පරිශ්‍ර මෙම අතුරු ව්‍යවස්ථාවල විධිවිධානවලට අනුකූල කරවීම සඳහා කළයුතු කාර්යයන් නියමිත කාලයක් ඇතුළතදී ඉටු කරන ලෙස බලපත්‍රධාරියාට ලිඛිතව දැන්වීමට සභාපතිවරයාට බලය ඇත. තවද, එම නිවේදනය ලද වහාම යථෝක්ත දැන්වීමේ විධිවිධාන ප්‍රකාර බලපත්‍රධාරියා විසින් ක්‍රියා කළ යුතුය.

9. ප්‍රාදේශීය සභාව මඟින් නිශ්චය කරන ලද, අප්‍රසන්න ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර සහ අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර පිළිවෙලින් අංක (i) (ii) හා (iii) දරන උපලේඛනවල ඇතුළත් කරනු ලැබ ඇත.

10. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම පිණිස යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් තමා වෙත ලැබී දින 30 ක් ඇතුළත පරිශ්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවලට අනුකූල වන්නේ නම් බලපත්‍රය නිකුත් කිරීම හෝ ප්‍රතික්ෂේප කරන්නේ නම් හේතු සහිතව ඒ බව ඉල්ලුම්කරුට දන්වා යැවීම සභාපතිවරයාගේ වගකීම වන්නේ ය.

11. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම පිළිබඳව ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තිය යටතේ කටයුතු කිරීම නිත්‍යානුකූල වන්නේ ය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"තැනැත්තා" යන්නට සංස්ථාගත කරන ලද හෝ නොකරන ලද පුද්ගල මණ්ඩලයක් ද,

"පාලනය භාර තැනැත්තා" යන්නට යම් භාරකරුවෙක්, ආරක්ෂකයෙක්, දේපළ ආරක්ෂකයෙක්, කළමණාකරුවෙක් හෝ යම් තැනැත්තෙක් වෙනුවෙන් යම් ව්‍යාපාරයක සංවිධානය, පාලනය හෝ කළමණාකරණය පැවරී ඇති වෙනත් තැනැත්තෙකු ද,

"බලපත්‍රධාරියා" යන්නෙන් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් තැනැත්තෙකු ද,

"සභාපති" යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

අදහස් කරනු ලැබේ.

### 1 වන උපලේඛනය - අප්‍රසන්න ව්‍යාපාර

(1) මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම.
(2) පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම.
(3) සම් පදම් කිරීම.
(4) සම් විකිණීමට තබා ගැනීම.
(5) සත්ව පාලනය (මස්, කිරි හෝ බිත්තර සඳහා)
(6) උම්බලකඩ නිෂ්පාදනය කිරීම.
(7) රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම.
(8) පශු වෛද්‍ය ගිලන්හලක් පැවැත්වීම.

(9) තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම.
(10) කරවල, ලුණුමාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 150 කට වැඩි ප්‍රමාණයක් තබා ගැනීම.
(11) මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.
(12) පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම.
(13) දුම්කොළ වියලීම.
(14) සත්ව ආහාර නිපදවීම.
(15) පුන්නක්කු නිපදවීම.
(16) සත්ව මාංශ හෝ ලේ පැසවීම.
(17) සබන් නිෂ්පාදනය කිරීම.
(18) සත්ව ඇටකටු ඇඹරීම හෝ තබා ගැනීම.
(19) ට්‍රන්ක් පෙට්ටි සෑදීම.
(20) අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම.
(21) ලෝහ සුන්බුන් තබා ගැනීම.
(22) ගෘහ භාණ්ඩ නිපදවීම.
(23) වේවැල් භාණ්ඩ නිපදවීම.
(24) වඩු කර්මාන්ත ශාලාවක් පැවැත්වීම.
(25) සිරප් හෝ පළතුරු බීම නිපදවීම.
(26) රසකැවිලි නිපදවීම.
(27) පොල් ලෙලි පෙඟවීම. (හෝ පල් කිරීම)
(28) බුරුසු වර්ග නිපදවීම. (දත් බුරුසු හැර)
(29) දත් බුරුසු නිපදවීම.
(30) රා එකතු කිරීම.
(31) විනාකිරි නිපදවීම.
(32) දැව ඉරීම.
(33) පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම.
(34) සෝඩා නිපදවීම.
(35) කෙඳි සායම් කිරීම.
(36) සම් භාණ්ඩ නිපදවීම.
(37) පළතුරු, මාළු හෝ වෙනත් ආහාර වර්ග ටින්වල ඇසිරීම.
(38) කෝපි, ධාන්‍ය වර්ග පිටි කිරීම.
(39) බේකින් පවුඩර් නිපදවීම.
(40) ගෑස් මැන්ටල් නිපදවීම.
(41) පොටි නිපදවීම.
(42) ඉටිපන්දම් නිපදවීම.
(43) කපුරු නිපදවීම.
(44) ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
(45) රෙදි සෝදන නිල් නිපදවීම.
(46) ලාකඩ නිපදවීම.
(47) සුවඳ විලවුන් නිපදවීම.
(48) පාසල් රටහුණු නිපදවීම.
(49) ටයර් හෝ ටියුබ් නිපදවීම.
(50) ටයර් නැවත පිරවීම.
(51) ටයර් ටියුබ් වෝල්කනයිසින් කිරීම.
(52) සිමෙන්ති නිපදවීම.
(53) සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බෙස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
(54) වැලි කඩදාසි නිපදවීම.
(55) ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
(56) ගඩොල් පිළිස්සීම.
(57) යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම.
(58) අම්ල නිෂ්පාදනය කිරීම හෝ නැවත ඇසිරීම.
(59) උළු නිපදවීම.
(60) පොහොර, හුණු,පිටි හෝ වෙනත් ද්‍රව්‍යයන් දමා තිබූ ගෝනි පිරිසිදු කර විකිණීම.
(61) යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම.

## II වැනි උපලේඛනය - අන්තරාදායක ව්‍යාපාර

(1) කළුගල් කැණීම හෝ කැඩීම.
(2) එළවළු තෙල් නිෂ්පාදනය.
(3) පොල්තෙල් නිෂ්පාදනය.
(4) ගිණිපෙට්ටි නිෂ්පාදනය.
(5) මෙතිලේටඩ් ස්ප්‍රිතු නිෂ්පාදනය.
(6) තේ පෙට්ටි නිපදවීම.
(7) කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම.
(8) කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය.
(9) පිදුරු තබා ගැනීම.
(10) පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම.
(11) ස්වර්ණාභරණ නිෂ්පාදනය හෝ අලුත්වැඩියා කිරීම.
(12) යන්ත්‍රානුසාරයෙන් ලී ඉරීම.
(13) හිරිගල් හෝ හුණුගල් කැණීම.
(14) යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන කම්හලක් පැවැත්වීම.
(15) හිස් ගෝනි හෝ හිස් බෝතල් තබා ගැනීම.
(16) පාපැදි හෝ යතුරු පැදි අළුත්වැඩියා කිරීම.
(17) පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්තර තබා ගැනීම.
(18) විසිරි පින්තාරු කිරීම.
(19) ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීම.
(20) ලෝහ සංස්කාර්ය කර්මාන්ත ආයුධ (යන්ත්‍රෝපකරණ, ආයුධ, උපකරණ නිපදවීම)

## III වැනි උපලේඛනය - අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර

(1) තලාතු මිණිරන් සුද්ද කිරීම.
(2) රසායනික ද්‍රව්‍ය පාවිච්චි කර කුරුඳු, කරඳමුංගු, එනසාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.
(3) ඩ්‍රයික්ලීන් කිරීම හෝ සායම් දැමීම.
(4) රෙදි මුද්‍රණය කිරීම හෝ සායම් දැමීම හෝ බතික් කිරීම.
(5) විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම.
(6) තෙල් හෝ සත්ව මේද නිපදවීම.
(7) හුණුගල් හෝ හිරිගල් පිළිස්සීම.
(8) ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම.
(9) මෝරතෙල් සකස් කිරීම.
(10) බෝට්ටු තැනීම.
(11) බැටරි විද්‍යුත් ආරෝපණය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
(12) ලෝහ වර්ග පෑස්සවීම.
(13) මෝටර් අළුත්වැඩියා කිරීම.
(14) මෝටර් වාහන අළුත්වැඩියා කිරීම.
(15) යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.
(16) වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.
(17) බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම.
(18) මෝටර් වාහන බොඩි තැනීම.
(19) කෘමිනාශක, දිලීර නාශක, පැළෑටි නාශක හෝ පළිබෝධ නාශක නිපදවීම
(20) විෂබීජ නාශක නිපදවීම.
(21) මදුරු දඟර නිපදවීම.

## සංචාරක වෙළඳාම සම්බන්ධ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන් තුළ සංචාරක වෙළඳාම විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව අනුව වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හෝ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන සංචාරක වෙළඳාම බලපත්‍රය හා අයදුම්පතක් සතුව ඇත්නම් මිස වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සංචාරක වෙළෙන්දෙකු වශයෙන් වෙළඳ කටයුතුවල යෙදීම නොකළ යුතුය.

3. මෙහි දෙවන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් සංචාරක වෙළඳ බලපත්‍රය අංක 02 උපලේඛනයට සාරානුකූල විය යුතු අතර, ඒ සඳහා අංක 01 උපලේඛනය ප්‍රකාර අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

4. (i) ඉහත 2 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර ලබා ගන්නා සෑම බලපත්‍රයක්ම කලින් අවලංගු කළහොත් මිස ලබාගත් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දින දක්වා බලපවත්වන්නේ ය. මෙසේ නිකුත් කරනු ලබන බලපත්‍රය මෙම අතුරු ව්‍යවස්ථා විධිවිධාන කඩ කිරීම හේතුකොට ඕනෑම අවස්ථාවක අවලංගු කිරීමේ බලය හා නැවත බලපත්‍රය නිකුත් කිරීමේ බලය බලධාරියා සතු වන්නේ ය.

(ii) සීමිත කාලයක් සඳහා නිකුත් කරනු ලබන තාවකාලික බලපත්‍රය එම බලපත්‍රයේ සඳහන් කාල පරිච්ඡේදය සඳහා පමණක් වලංගු වන්නේ ය.

5. කුමන හේතුවක් නිසා හෝ ඉහත දෙවැනි අතුරු ව්‍යවස්ථා ප්‍රකාර ලබාගන්නා බලපත්‍ර හා හැඳුනුම්පත්‍ර අන්සතු නොකළ යුත්තේ ය.

6. සෑම සංචාරක වෙළෙන්දෙක්ම ව්‍යාපාරික කටයුතුවල නිරත වී සිටින වේලාවන්හි දී සභාපතිවරයා විසින් නිකුත් කර ඇති හැඳුනුම්පත පැහැදිලිව පෙනෙන සේ පැළඳ සිටිය යුතු ය.

7. නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකටම සුදුසු යැයි අදහස් කරනු ලබන කොන්දේසි ඇතුළත් කිරීමට සභාපතිවරයාට බලය ඇත.

8. මෙම අතුරු ව්‍යවස්ථාව යටතේ බලපත්‍ර ලබා ගැනීම සඳහා සභාව විසින් කලින් කල යෝජනා සම්මුතීන් මගින් නියම කරනු ලබන ගාස්තු ප්‍රමාණයන් අනුව ගාස්තුවක් ගෙවනු ලැබිය යුතුය.

9. බලපත්‍රලත් සෑම සංචාරක වෙළෙන්දකුම සංචාරක වෙළඳ කටයුතු පෙ. ව. 6.00 සිට ප. ව. 10.00 අතර කාල සීමාවක් තුළ කළ යුතු ය. එසේ වුව ද විශේෂ උත්සව අවස්ථාවන් හි දී මෙම කාල සීමාවන් සභාපතිවරයා විසින් ලිහිල් කරනු ලැබිය හැකිය.

10. කිසිම බලපත්‍රධාරියෙකු හෝ ඔහුගේ නියෝජිතයෙක් වෙළඳ කාල සීමාවෙන් බැහැරව සංචාරක වෙළඳ කුටිය තුළ හෝ අසල නේවාසිකව ගත නොකළ යුතුය.

11. සංචාරක වෙළඳ කුටි භාවිතා කරන්නේ නම් එකී වෙළඳ කුටි තුළ හෝ ඒ අවට කිසිදු ආකාරයක ආහාර පිසීමක් හෝ පිළියෙල කිරීමක් නොකළ යුතු ය.

12. සංචාරක වෙළඳාමේ දී ආහාර පාන විකිණීම කරනු ලබයි නම් සියළු ආහාර පාන වර්ග සෞඛ්‍ය ආරක්ෂිත ලෙස ආවරණය කර තබා විකිණිය යුතු අතර, ආහාර පාන ගැනීම සඳහා සුදුසු වන හැඳි ආදී උපකරණ භාවිතා කළ යුතුය. එසේම ආහාර පනතේ විධිවිධානවලට අනුකූලව සිය වෙළඳාම කළ යුතුය.

13. ගෝ ඝාතක ආඥාපනතේ සඳහන් කර ඇති සතුන්ගේ මස් නොවිකිණිය යුතුය.

14. බලපත්‍රලාභියා බෝවන රෝගයකින් පෙළෙන්නේ නම්, ව්‍යාපාරික කටයුතුවල යෙදීමෙන් වැලකිය යුතු අතර, ඒ සඳහා බෝවන රෝගයකින් පෙළෙන අයෙකු නොයෙදවිය යුතුය.

15. සංචාරක වෙළෙන්දෙකු විසින් කිසියම් බෝවෙන රෝගයක් පැතිරෙමින් පවතින හෝ පැතිරී ඇති ප්‍රදේශයක පිළියෙල කරන ලද ආහාර ද්‍රව්‍ය හෝ වෙනත් ද්‍රව්‍ය විකුණනු ලැබීම සභාපතිවරයා විසින් තහනම් කළ යුතුය.

16. අපද්‍රව්‍ය හෝ අපජලය පොදු ස්ථානවල නොදැමිය යුතු අතර, ඒ සඳහා සභාපතිවරයා සෑහීමකට පත් වන ආකාරයකට නිසි විධිවිධාන සලසා තිබිය යුතුය.

17. සංචාරක වෙළඳාම නිසා ජනනය වන කසල හා අපද්‍රව්‍ය හා අපජලය බැහැරලීම සඳහා සභාවේ එකඟතාවය පරිදි ක්‍රමාණුකූල වැඩ පිළිවෙලක් සංචාරක වෙළෙන්දා විසින්ම සකස් කොට අනුගමනය කළ යුතුය.

18. ප්‍රාදේශීය සභාවේ බලයලත් නිලධරයකු ඉල්ලා සිටි විටක දී සිය බලපත්‍රය හා හැඳුනුම් පත්‍රය බලපත්‍රධාරියා විසින් ඉදිරිපත් කළ යුතුය.

19. පොදු වෙළඳපළ පරිශ්‍රය තුළ සංචාරක වෙළඳාම තහනම්ය. කිසියම් ස්ථානයක දීර්ඝ වේලාවක් රැඳී සිට වෙළඳාම් කිරීම නොකළ යුතුය.

20. නිසි අධිකරණයක් මඟින් බලපත්‍රයක් අවලංගු කරනු ලැබූ විට යථෝක්ත බලපත්‍රය නොපමාව සභාපතිවරයා වෙත ආපසු භාරදිය යුතුය.

21. සංචාරක වෙළඳ බලපත්‍රය හා සභාව විසින් නිකුත් කරනු ලබන හැඳුනුම් පත්‍රයක් නොමැති විට හෝ මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීම සම්බන්ධව ප්‍රාදේශීය සභා පනතේ 122(02) වගන්තිය යටතේ කටයුතු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

මෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"බලයලත් නිලධාරියා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පැවරූ සභාවේ නිලධරයෙකුද,

"සංචාරක වෙළඳාම" යන්නෙන් සභා බල ප්‍රදේශය තුළ ඇවිද හා පා පැදියකින්, මෝටර් වාහනයකින්, කරත්තයකින්, රෝද සවිකර ඇති වෙළඳ කුටියකින් හෝ සිවුපාවකු සහාය කරගනිමින් කරනු ලබන වෙළඳාමද,

"සභාව" යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාව ද,

"සභාපතිවරයා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

අදහස් වේ.

### 01 වැනි උපලේඛනය

*සංචාරක වෙළඳ බලපත්‍රය :-*

සීමාව තුළ පහත කොන්දේසි ඉටු කිරීමට යටත්ව පහත විස්තර සඳහන් අයට සංචාරක වෙළඳාමේ යෙදීමට මෙම බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

1. සම්පූර්ණ නම :————————.
2. ලිපිනය :————————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :————————.
4. කරනු ලබන වෙළඳාම :————————.
5. වෙළඳාම කරන සීමාව :————————.

6. ගෙවන මුදල :———. දිනය :———. බිල් අංකය :———.

7. බලපත්‍රයේ අංකය :—————.

*කොන්දේසි :-*

1. නිල ඇඳුමක් පැළඳීම
2. මහජනයාට ප්‍රදර්ශනය වන ලෙස හැඳුනුම්පත් පැළඳීම
3. මත්පැන්, දුම්වැටි භාවිතයෙන් තොරවීම
4. ඇතුල්වීම දොරටු හා පඩිපෙලවල වෙළඳාම් නොකිරීම
5. විනීතව හා විනයගරුකව හැසිරීම
6. මගීන් විසින් ඉවතලන දෑ කසල බඳුන්වලට දැමීම
7. මාසික වෙළඳ ගාස්තුව 10 වැනි දිනට පෙර ගෙවීම
8. වෙළඳ භාණ්ඩ වන පිහියා වැනි ආයුධ මහජනයාට ප්‍රදර්ශනය වන ආකාරයට භාවිතා නොකල යුතුය (ඉහත කොන්දේසි කඩ කිරීම හෝ නියමිත කාලය තුළ මුදල් ගෙවීමෙන් වැළකීම, බලපත්‍රය අවලංගු කිරීමට හේතුවේ.)

**02 වැනි උපලේඛනය**

*සංචාරක වෙළෙන්දෙකු වශයෙන් ලියාපදිංචි වීමේ ඉල්ලුම් පත්‍රය :*

1. සම්පූර්ණ නම :—————.

2. ලිපිනය :—————.

3. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

4. කරනු ලබන වෙළඳාම :—————.

5. සංචාරක වෙළඳාමේ යෙදී ඇති කාල සීමාව :—————.

6. පැරණි වෙළෙඳ හැඳුනුම්පත්/බලපත්‍ර අංකය :—————.

7. නගර සීමාව තුළ ස්ථිර කඩවලට හිමිකමක් තිබේ නම් කඩ අංකය හා වරිපනම් අංකය :—————.

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව සහතික කරන අතර, ප්‍රාදේශීය සභා/නගර සභා විසින් විකිණීමට අවසර නොදෙන ද්‍රව්‍ය අලෙවි නොකරන බවටත්, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව ගනු ලබන තීරණවලට අනුව කටයුතු කරන බවටත්, සංචාරක වෙළෙන්දෙකු වශයෙන් ලියාපදිංචිවීමේ අවසරය අයිතිවාසිකමක් ලෙස නොසළකන බවටත්, එකඟතාවයට යටත්ව සංචාරක වෙළෙන්දෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

**වයඹ පළාත් සභාව**

**ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම**

01. මෙම අතුරු ව්‍යවස්ථාව වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ඇතුළත වාහන නතර කර තැබීමේ පොදු ස්ථාන ඇති කිරීම හා එම ස්ථානවල වාහන නවතා තැබීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හැඳින්වේ.

02.(i) මෙහි මින්මතු "සභාපතිවරයා" වශයෙන් හඳුන්වනු ලබන වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් තම බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සම්බන්ධව සුදුසු ස්ථාන ප්‍රකාශයට පත් කිරීම නතර කරනු ලැබිය හැකිය.

(ii) ආරක්ෂක හේතුන් මත හෝ වෙනත් හේතුන් මත වාහන නතර කර රඳවා තැබීම තහනම් ස්ථානයක් බවට පැහැදිලිව දිස්වන ආකාරයට ප්‍රදර්ශනය කරනු ලබන දැන්වීමක් මගින් වාහන නතර කර නොහැකි ස්ථාන ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකිය.

03. (2.2) අතුරු ව්‍යවස්ථාවේ දක්වා ඇති දැන්වීමක් මගින් වාහන නතර කර රඳවා තැබීම තහනම් කරනු ලබන ස්ථානයක වාහනයක රියදුරු විසින්,

*(අ)* නිසි බලධාරියෙකු හෝ බලධාරයෙකු විසින් එම වීදියේ හෝ මාර්ගයේ හෝ ඉදි කරනු ලැබ ඇති ප්‍රදර්ශන කරනු ලැබ ඇති කිසියම් වාහන සංඥාවකට හෝ දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීමේ හෝ ;

*(ආ)* එම වීදියේ හෝ මාර්ගයේ හෝ ඒ අවස්ථාවේ පවත්නා ගමනා ගමනයක පිළිවෙල නිසි පරිදි අනුගමනය කිරීම හෝ;

*(ඇ)* කිසියම් තැනැත්තෙකුට එම වාහනයෙන් බැසීමට හෝ එම වාහනයට ගොඩ විමට ඉඩ දීම, හෝ;

*(ඈ)* එම වාහනයට බඩු පැටවීමේ හෝ එම වාහනයෙන් බඩු බෑමේ හෝ;

කාර්යයන් සඳහා අවශ්‍ය කාලයක් හැර එම වාහනය වීදියේ හෝ මාර්ගයේ නතර කර තැබීම නොකළ යුතුය.

04. සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයෙහි ඇත්නම් මිස කිසිම තැනැත්තෙකු විසින් වාහන නතර කර තැබීම සඳහා වෙන්කර ඇති ස්ථානයක වාහන නතර කර තැබීම සඳහා වෙන්කර ඇති ස්ථානයක වාහනයක් නවතා තැබීම නොකළ යුතුය.

05. ඉහත 4 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් පරිදි නිකුත් කරන ලද අවසර පත්‍ර සඳහා සභා සම්මුතියෙන් අනුමත කර ප්‍රසිද්ධ කරනු ලැබූ ගාස්තුවක් අය කරනු ලැබිය හැකිය.

06. ඉහත අංක 04 වැනි අතුරු ව්‍යවස්ථාවේ අවසර පත්‍රයක් අවස්ථාවෝචිත පරිදි රජයේ දෙපාර්තමේන්තුවක්, සංස්ථාවක් හෝ සංස්ථාගත වූ පුද්ගල මණ්ඩලයක් විසින් සභාව කලින් කළට නියම කරනු ලබන මාසික ගාස්තුවක් ප්‍රාදේශීය සභාව වෙත ගෙවනු ලැබීමෙන් ඒ දෙපාර්තමේන්තුවට, සංස්ථාවට හෝ පුද්ගල මණ්ඩලයකට අයත් මෝටර් වාහන සඳහා මාසික හෝ වාර්ෂික අවසර පත්‍රයක් ලබාගත හැකිය.

07. ඉහත අතුරු ව්‍යවස්ථා යටතේ අවසර පත්‍රයක් ලබා ගන්නා සෑම තැනැත්තෙකු විසින් ම එම අවසර පත්‍රය වාහනයෙන් පිටතට පැහැදිලිව පෙනෙන පරිදි වාහනය තුළ රඳවා තැබීමට කටයුතු කළ යුතුය.

08. කිසියම් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක්, කිසියම් නිශ්චිත පන්තියක හෝ වර්ගයක හෝ මෝටර් වාහන සඳහා වෙන්කරනු ලැබ ඇති අවස්ථාවක කිසිම තැනැත්තෙකු විසින් එම පන්තියට හෝ වර්ගයට අයත් නොවන වෙනත් මෝටර් වාහනයක් එහි නතර කර තැබීම නොකළ යුතුය.

09. වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයකට ඇතුළුවන හෝ ඉන් පිටව යන හෝ වෙනත් මෝටර් වාහනයකට බාධාවන ආකාරයට කිසිම තැනැත්තෙක් විසින් වාහන නතර කර තැබීමේ ස්ථානයක මෝටර් වාහනයක් එහි නතර කර තැබීම නොකළ යුතුය.

10. අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති කාල වේලාවන් හැර වෙනත් කාල සීමාවන් තුළ වාහනය නවතා තැබීම නොකළ යුතුය.

11. අවසර පත්‍රය දරන්නා විසින් තම වාහනය නවතා තැබීමේ දී වෙනත් කිසිදු පුද්ගලයෙකුට හෝ පොදු දේපළකට හෝ පුද්ගලික දේපළකට අවහිර නොවන පරිදි සභාව විසින් නියම කරනු ලබන ආකාරයට වාහනය නවතා තැබීම කළ යුතුය.

12.(i) වාහන නතර කර ගැනීමේ පොදු ස්ථානයක ඇති වාහනයක් ඉවත් කර ගැනීම සඳහා අත්‍යාවශ්‍යවන්නාවූ අළුත්වැඩියාවක් මිස එවැනි ස්ථානයක මෝටර් වාහනයක් අලුත්වැඩියා නොකළ යුතුය.

(ii) වාහනය නවතා තබන ස්ථානයේ සාමය කඩ කරන ආකාරයේ යම් ක්‍රියාවක් හෝ සදාචාරයට හානිවිය හැකි ක්‍රියාවක් කිරීමෙන් වැළකිය යුතුය.

(iii) වාහන නවතා තැබීමේ පොදු ස්ථානයක් තුළ නවතා ඇති වාහනවලින් අසාමාන්‍ය ශබ්ද පිටවන ආකාරයෙන් වාහන ඇන්ජිම පණ ගැන්වීම නොකළ යුතුය.

(iv) මෝටර් වාහන නතරකර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනයක් නතර කර තිබිය දී කිසිම තැනැත්තෙකු විසින් එම වාහනය සේදීම හෝ සේදීමට සැලැස්වීම හෝ නොකළ යුතුය.

13. පොලිස් නිලධාරියෙකු හෝ රථ වාහන පාලන හෝ වාහන නතරකර තැබීමේ පොදු ස්ථානයක නතරකර ඇති යම් මෝටර් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියදුරුගෙන් එම මෝටර් වාහනය වෙනුවෙන් නිකුත් කර ඇති වාහන නවතා තැබීමේ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ කිනම් අවස්ථාවක වුව ද, ඒ අවසර පත්‍රය එම අයිතිකරු හෝ රියදුරු විසින් ඉදිරිපත් කළ යුතුය.

14. යම් නාගරික ප්‍රදේශයක හෝ මහජනතාව රැස්වෙන යම් නිශ්චිත ස්ථානයක වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් සම්මත කරන මායිම් ඇතුළත වූ යම් වීථියක හෝ මාවතක, වාහන නවතා රඳවා තබන කාල සීමාව පාලනය කිරීමේ අරමුණින් එසේ නවතා රඳවා තබන කාල ප්‍රමාණය අනුව සභාව විසින් සම්මත කර ගන්නා ගාස්තු ප්‍රමාණයක් අයකර ගත හැකි වන්නේ ය.

15. වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත ඇති යම් මාවතක හෝ වීථියක හෝ ආදායමක් උපයා ගැනීමේ අරමුණ ඇතිව රඳවා ඇති යම් වාහනයකින් සභාව විසින් කළින් කළ සම්මත කර ගන්නා පරිදි යම් ගාස්තු ප්‍රමාණයක් අය කර ගත හැකි වන්නේ ය.

16. අවසර පත්‍රයක් ලබා ගෙන ත්‍රීරෝද රථ නතර කර තැබීමට කටයුතු කරන අවස්ථාවල දී එම අවසර පත්‍රයේ සඳහන්වන වාහන නතර කිරීමේ ස්ථානයක හැර සභාව විසින් නම් කර ඇති වෙනත් නතර කිරීම් ස්ථානයක ත්‍රීරෝද රථය නතර කර තැබීම නොකළ යුතුය.

17. වාහන නතර කර තැබීම සඳහා වන පොදු ස්ථානයක කුලී මුදලක් අපේක්ෂාවෙන් ධාවනය කිරීම සඳහා නවතා තබන ත්‍රීරෝද රථ සඳහා පහත සඳහන් කොන්දේසි හා නියමයන් අදාළ විය යුතු වේ :—

(i) 04 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් අයදුම් කරන අය ත්‍රීරෝද රථයේ හිමිකරු නොවේ නම් අයදුම්කරු වෙත අවසර පත්‍රය නිකුත් කිරීම සම්බන්ධයෙන් ත්‍රීරෝද රථයේ හිමිකරුගේ එකඟතාවය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

(ii) අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් කර ඇති ස්ථානයේ හැර වෙනත් කිසිදු ස්ථානයක ත්‍රීරෝද රථය කුලී ගමන් අපේක්ෂාවෙන් නවතා තැබීම නොකළ යුතුය.

(iii) කුලී ගමන් ලබා ගැනීම අන්‍යොන්‍යතා එකඟතාව මත සිදු කළ හැකිය. ඒ සම්බන්ධව ඔවුන්ට එකඟතාවයකට එළඹීමට නොහැකි වන්නේ නම් සභාපති විසින් ලබා දෙන උපදෙස් මත කුලී ගමන් ලබා ගැනීම කළ යුතුවේ.

18. මෙම අතුරු ව්‍යවස්ථාව සෑම දිනකම පෙරවරු 6.00 සිට පස්වරු 8.00 දක්වා වූ කාලය තුළ වලංගු වන්නේ ය.

19. මෙම අතුරු ව්‍යවස්ථාව කඩ කරනු ලබන පුද්ගලයින්ට ප්‍රාදේශීය සභා පනතේ 122 (2) වැනි වගන්තිය ප්‍රකාර දඬුවම් නියම කිරීම කළ යුතු ය.

මෙම කාල සීමාවන් හා ගාස්තු සභාපතිවරයා විසින් සභා අනුමැතියෙන් පසු සංශෝධනය කිරීමේ අවකාශ ඇති අතර, එහි සංශෝධනයන් ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කළ යුතුය.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස :—

මෙම අතුරු ව්‍යවස්ථාවේ "සභාපතිවරයා" යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,
"ප්‍රාදේශීය සභාව" යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාව ද,
"පොලිස් නිළධාරියා" යන්නෙන් පොලිස් නිළ ඇඳුමෙන් සැරසුන ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් නිලධාරියෙකු ද,
"මෝටර් වාහනයක්" යන්නෙන් වාහන නවතා තැබීම සම්බන්ධව විධිමත් පාලනයක් පවත්වා ගැනීමේ කාර්යය සඳහා සභාපතිවරයා හෝ ලේකම්වරයා විසින් පනවනු ලබන සියළු රාජකාරි ඉටු කිරීමට පත් කරන ලද වෙන්නප්පුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ නිලධාරියෙකු හෝ සේවකයකු ද,
"ලේකම්" යන්නෙන් අදාළ ප්‍රාදේශීය සභාවේ ලේකම් ද,
"වාහන නවතා තැබීම සඳහා වන පොදු ස්ථානය හා වාහන නතර කර රඳවා තැබීම තහනම් කරන ලද ස්ථානය" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මුතියක් මඟින් නම් කරනු ලබන ස්ථානයන් ද අදහස් වේ.

### වයඹ පළාතේ පළාත් සභාව

### ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන් සහ රෝග කාරක කෘමීන් විනාශ කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

මෙම අතුරු ව්‍යවස්ථාව වෙන්නප්පුව ප්‍රාදේශීය සභා සීමාව තුළ මදුරුවන්, රෝග කාරක කෘමීන් බෝවීම මර්ධනය කිරීම හා විනාශ කිරීම මඟින් බල ප්‍රදේශයේ පාරිසරික තත්ත්වය වැඩි දියුණු කිරීම සහ බෝවන රෝග පැතිරයාම වැළැක්වීම සඳහා පනවනු ලැබේ.

2. මෙම අතුරු ව්‍යවස්ථාව අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කිසියම් පුද්ගලයකු හෝ තැනැත්තෙකු විසින් කිසිදු ස්ථානයක මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් වර්ධනය වීමට තුඩු දෙන පරිදි කටයුතු කිරීම, කරවීම හෝ එසේ කටයුතු කිරීමට ඉඩ හැරීම හෝ නොකළ යුතුය.

3. මදුරුවන් හා රෝග කාරක කෘමීන් විනාශ කිරීම සඳහා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෑම ස්ථානයක ම පදිංචිකරුවන් විසින්,

(1) සියලු නොවැසූ ටින්, බෝතල්, පෙට්ටි, ප්ලාස්ටික් කෑන්, ඉවත දැමූ ටයර්, පොල්කටු, පොල් කෝම්බ සහ ජලය රැස්ව රඳා පැවතීමට ආධාර විය හැකි ස්ථාන, ඒ ස්ථානයේ ඇති වෙනත් යම් ජලය රඳා පැවතිය හැකි භාණ්ඩ, ද්‍රව්‍ය, භාජන ආදිය ඉවත් කරවීමට හෝ අන්‍යාකාරයකින් හෝ සාර්ථක ලෙස බැහැර කර දැමීමට සැලැස්විය යුතුය.

(2) නේවාසික හෝ නේවාසික නොවන ස්ථානවල, ගොඩනැගිලි වල වැහි පීහිලි, පහතට වැටෙන පයිප්ප, වැනි ඉදිකිරීම්වල සහ ගෙවතුවල ඇති කානුවල ජලය බැස යාම ක්‍රමවත්ව පවත්වාගෙන යා යුතුය. ඒවායේ අවහිරකම් නිරන්තරයෙන් පරීක්ෂා කර බලා ඉවත් කළ යුතුය.

(3) නේවාසික හෝ නේවාසික නොවන ස්ථානවල ඇති සියලුම ජල බඳුන්, ටැංකි සහ ජලය එක්රැස් කරන වෙනත් භාජන මනා තත්වයකින් යුතුව හා කාලීන ප්‍රතිසංස්කරණයන් සහිතව පවත්වාගෙන යාමට ද, ඒවා මදුරුවන්ගෙන් හා කෘමීන්ගෙන් ආරක්ෂා වන පරිදි වසා තැබීමට හෝ ආවරණය කර තැබීමට ද නැතහොත්, ඒවායේ මදුරුවන්, කෘමීන් බෝවීම වැළැක්වෙන තත්වයකින් තබා ගැනීමට ද ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකුට පරීක්ෂා කර බැලීමේ කාර්යය සඳහා සහ මදුරුවන්, කෘමි සතුන් බෝවීම වැලැක්වීම සඳහා අවශ්‍ය විය හැකි කටයුතු කරගෙන යාම සඳහා ද, ඒවාට පහසුවෙන් හා ආරක්ෂා සහිතව යාහැකි ප්‍රවේශයක් ඇති කිරීමට ද කටයුතු කළ යුතුය.

(4) ඉඩම් වල ඇති සියලුම ළිං යහපත් තත්වයෙන් පවත්වාගෙන යායුතු අතර, මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝ නොවීම පිණිස වසා හෝ ආවරණය කර තැබීම හෝ මදුරුවන්, රෝග කාරක කෘමීන් බෝවීම වළක්වන තත්වයෙන් තබා ගැනීමට අවශ්‍යය කටයුතු සැලැස්විය යුතුය.

(5) හිස් කිරීමට හැකිවන ආකාරයෙන් සාදා ඇති යම් කෘත්‍රිම පොකුණක් වේ නම්, එය යටත් පිරිසෙසන් සතියකට එක් වරක්වත් හිස්කොට පවිත්‍ර කළ යුතුය.

(6) ගෙවතුවල හා ඉඩම්වල ඇති කාණුවලින් බැස යන ජලය එකතු වීමෙන් දියකඩිති සෑදීම වැලැක්වීම සඳහා ඒවා නිතිපතා නඩත්තු කළ යුතුය.

(7) ආහාර පිණිස හෝ අලංකාරය සඳහා වවනු ලබන පැලෑටි හැර අනෙකුත් සියලුම ලඳු කැළෑ, වගා සහ වෘක්ෂලතාදිය මනුෂ්‍ය වාසස්ථානයන් වශයෙන් භාවිතා කරන යම් ගොඩනැගිල්ලක හෝ ඉදිකිරීමක සිට මීටර් 05 ක අර්ධ විශ්කම්භයක් ඇතුළත වූ සෑම කොටසකින්ම ඉවත් කරනු ලැබිය යුතුය.

(8) සියලුම ගල්වලවල්, මැණික් ගැරූ වලවල්, මැටි වලවල් හෝ වෙනත් ඕනෑම කරුණක් සඳහා තනන ලද වලවල් ඒවායේ වතුර එකතු වීම වලක්වන ආකාරයෙන් පවත්වාගෙන යා යුතුය.

(9) දිය පරඬැල්, පෙඳපාසි, තෙල්පාසි, බරවා පාසි යනුවෙන් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන ජලජ පැලෑටි හෝ මදුරුවන් හා කෘමීන් බෝවීමට ඉඩකඩ සලසන බවට කලින් කල දැනගන්නට ලැබෙන වෙනත් යම් ජලජ පැලෑටියක් හෝ පැලෑටි ඉවත් කොට විනාශ කර දැමිය යුතුය.

මෙම අතුරු ව්‍යවස්ථාවෙහි ඉහත (9) අනුවගන්තියේ සඳහන් කරන ලද පැලෑටි යම් දියමාර්ගයක් දිගේ පාවී යාම නවත්වන පරිදි සුදුසු බාධක ඉදිකිරීමෙන් ඒවා පැතිරීම වලක්වාලිය යුතුය.

(10) වැසිකිලි, දියවලවල්, දිය උරන වලවල්, මුද්‍රා තැබූ වලවල් හා ඒවායේ වට පිටාව ද ඇතුළුව ඒ ස්ථානයේ ඇති සියලු වැසිකිලි මදුරුවන් බෝවීම වලක්වන තත්ත්වයෙන් පවත්වාගෙන යා යුතුය.

4. ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් හෝ තත්කාර්යය සඳහා පොදුවේ හෝ විශේෂයෙන් ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියෙකු විසින් හෝ ඕනෑම දිනයක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 ඇතුළත යම් වේලාවක දී යම් ස්ථානයකට ඇතුල් වී පහත දැක්වෙන කරුණු සහතික කර ගැනීම පිණිස ඒ ස්ථානය පරීක්ෂා කර බැලීම නීත්‍යානුකූල වන්නේ ය.

(1) ඒ ස්ථානය මදුරුවන් හා කෘමීන් ගැවසෙන ස්ථානයක් ද යන වග,

(2) ඒ ස්ථානයේ පදිංචිකරුවන් විසින් අතුරු ව්‍යවස්ථාවල තිබෙන නියමයන් පිළිපැද තිබේ ද යන වග,

(3) ඒ ස්ථානයේ මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා සහ විනාශ කිරීම සඳහා යම් පියවර ගැනීම අවශ්‍ය වේ නම්, එම පියවර මොනවාද යන වග, හා

(4) ඒ ස්ථානයේ කෘමි නාශක ඉසීම සාර්ථක ලෙස කර තිබේ ද යන වග.

5. (1) සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් තත්කාර්යය සඳහා විශේෂයෙන් හෝ පොදුවේ ලිඛිතව බලය දෙන ලද යම් නිලධාරියෙකු විසින් යම් ස්ථානයක අවශ්‍යවේ යැයි සලකනු ලබන පරීක්ෂණයකින් පසු, එකී ස්ථානයේ මදුරුවන් හෝ රෝග කාරක කෘමීන් විනාශ කිරීමට, වර්ධනය වීම මැඩ පැවැත්වීමට අවශ්‍ය කාර්යයන් ඉටු කරන ලෙස ලිඛිත දැන්වීමකින් ඒ ස්ථානය අයිතිකරුට හෝ පදිංචිකරුට නියම කරනු ලැබිය හැකිය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත (1) වගන්තිය යටතේ දැන්වීමක් භාර දෙන ලද යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ දී එකී නියමයන් ඉටු කරනු ලැබිය යුතුය.

6. (1) සභාපතිවරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව සහ ඒ ස්ථානයෙහි මදුරුවන් හා රෝග කාරක කෘමීන් බෝවීම වැලැක්වීම සඳහා නිලධාරියා විසින් දෙනු ලබන උපදෙස්වලට අනුකූලව හැර යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් එහි යම් ළිඳක් තැනීම හෝ ටැංකියක්, පොකුණක්, ජල භාජනයක්, වතුර මලක් හෝ වතුර රඳවා තබන වෙනත් ස්ථිර භාජනයක් ඉදිකිරීම හෝ නොකළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ ඉහත (1) වැනි වගන්තියේ සඳහන් විධිවිධානවලට පටහැනි වන සේ එම වගන්තියේ සඳහන් ඉදිකිරීමක් කරනු ලැබූ අවස්ථාවක, සභාපතිවරයා විසින් එම ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු වෙත භාරදෙනු ලැබූ ලිඛිත දැන්වීමක් මගින් එම දැන්වීමේ නිශ්චිව සඳහන් කරනු ලැබූ කාලයක් තුළ දී ළිඳ, ටැංකිය, පොකුණ, ජල භාජනය, වතුර මල හෝ භාජනය ගොඩනැගිලි ඉදිකිරීමේ මතුපිට නියම කරනු ලබන ද්‍රව්‍යයෙන් පුරවා වසා දමන ලෙස හෝ අන්‍යාකාරයකින් විනාශ කර දමන ලෙස නැතහොත් ඒ කාලය ඇතුළත ඒ

දැන්වීමේ සඳහන් කර ඇති ආකාරයට එය වෙනස් කරන ලෙස නියම කළ හැකි වන්නේ ය.

7. (1) 05 හෝ 06 වන අතුරු ව්‍යවස්ථාවන් යටතේ දැන්වීමක් යම් ස්ථානයක අයිතිකරුට හෝ පදිංචිකරුට භාරදීමේ දී පෞද්ගලිකව භාරදීමෙන් හෝ එම දැන්වීම් එකී ස්ථානයේ හොඳින් පෙනෙන තැනක ඇලවීමෙන් හෝ ක්‍රියාත්මක කළ හැකිය.

(2) යම් ස්ථානයක සම අයිතිකරුවන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් විසින් හවුලේ අධිවාසය කරන අවස්ථාවක එම අයිතිකරුවන්ගෙන් එක් එක් අයිතිකරුවකු 7(01) වන අතුරු ව්‍යවස්ථාවේ නියමයන් සහ 5 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ඔවුන් අතරින් යම් අයෙකුට භාරදෙනු ලබන යම් දැන්වීමක නියමයක් ඉටු කිරීම සම්බන්ධව යම් පැහැර හැරීමකට හෝ ඉටු නොකර සිටීමකට පොදුවේ සහ වෙන් වෙන්ව වගකිව යුතු ය.

(3) 5 වන හෝ 6 වන අතුරු ව්‍යවස්ථා යටතේ දැන්වීමක් භාරදෙනු ලැබූ යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කාලය තුළ ඒ දැන්වීමේ නියමයන් ඉටු කිරීම අතපසු කරන හෝ ඉටු නොකරන අවස්ථාවක, සභාපතිවරයා විසින් හෝ ඒ දැන්වීම නිකුත් කරන ලද නිලධාරියා විසින් හෝ තත්කාර්ය සඳහා බලය පවරන ලද යම් නිලධාරියෙකු විසින් ඕනෑම දිනයක පෙ. ව. 6.00 සිට ප. ව. 6.00 අතර වේලාවක අවශ්‍යය විය හැකි සහායකයින් සහ සේවකයින් සමග එකී ස්ථානයට ඇතුල් වී ඒ දැන්වීමේ නිශ්චිතව සඳහන් කර ඇති කටයුතු හෝ පියවර ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කරවීම හෝ ක්‍රියාත්මක කිරීමට සැලැස්වීම කරනු ලැබිය හැකිය.

3(1) සභාපතිවරයා විසින් නිකුත් කරන ලද විධිමත් බලපත්‍රයක් යටතේ මිස කිසිම තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටලයක්, ලැගුම් නිවාසයක් හෝ නවාතැන්පලක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

(4) යම් ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු වෙත 5 වැනි, 6 වැනි සහ 7 වැනි අතුරු ව්‍යවස්ථාවන් යටතේ භාරදෙන ලද දැන්වීමක නිශ්චිතව සඳහන් යම් කටයුත්තක් හෝ පියවරක් සභාපතිවරයා විසින් හෝ බලය පවරනු ලැබූ නිලධරයෙකු විසින් ක්‍රියාත්මක කළ විට හෝ ඉටු කළ විට ඒ කටයුතු හෝ පියවර ක්‍රියාත්මක කිරීමෙහිලා හෝ ඉටු කිරීමෙහිලා දරන්නට සිදු වූ වියදම් ප්‍රමාණය, එකී ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් සභාපතිවරයා වෙත ගෙවිය යුතුය. සභාපතිවරයා සිය අත්සන යටතේ ඒ පිළිබඳ ලියවිල්ලකින් කරනු ලබන ඉල්ලීමකින් පසු දින 14 ක් ඇතුළත ඒ මුදල අයිතිකරු හෝ පදිංචිකරු විසින් ගෙවනු ලැබිය යුතු අතර එසේ ගෙවනු නොලැබුවහොත් එය වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ලැබිය යුතු දඩ මුදලක් ලෙස ඒ අයිතිකරුගෙන් හෝ පදිංචිකරුගෙන් අය කර ගනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය.

8. මෙම අතුරු ව්‍යවස්ථාවලින් කිසිවක් යටතේ සිය කාර්යය නීත්‍යානුකූල ලෙස ක්‍රියාත්මක කිරීමේ දී කිසිදු තැනැත්තෙකු විසින් දැන දැනම හෝ හිතාමතා සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරියාට අවහිර කිරීම හෝ බාධා කිරීම නොකළ යුතුය.

9. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම පිළිබඳ ප්‍රාදේශීය සභා පනතේ 122 (02) වගන්තිය ප්‍රකාරව කටයුතු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

F 2 – B 80307 (S/E)

10. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල—

"අයිතිකරු" යන්නෙන් යම් අයිතිකරුවෙකු සහ බදුකරුවෙකු ද, යම් ස්ථානයක කුලියට හෝ එලදාවට කවර හෝ ආකාරයක අයිතියට හිමිකම් ඇති යම් තැනැත්තෙකු ද,

"පදිංචිකරු" යන්නෙන් යම් ස්ථානයක පදිංචිව සිටින්නා වූ හෝ තමා වෙනුවෙන් හෝ තවත් අයෙකු වෙනුවෙන් නියෝජිතයන් වශයෙන් හෝ එහි භාරකාරිත්වය, කළමනාකරණය හෝ පාලනය දරන තැනැත්තෙකු, නමුත් නවාතැන්කරුවෙකු නොවන අයෙක් ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන් අදාල සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ එම සභාවේ යම් නිලධාරියෙකු ද, සේවකයෙකු ද,

"සභාව" යන්නෙන් අදාල ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් අදාල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"ස්ථානයක්" යන්නෙන් යම් ඉඩමක්, නිවසක්, ගොඩනැගිල්ලක් හෝ ඉදිකිරීමක් ඇතුළත් වන අතර යම් පොකුණක්, ටැංකියක්, වැවක ජල මාර්ගයක, කාණුවක හා ගඟක නිම්නය ද අදහස් වේ.

## ප්‍රාදේශීය සභා සීමාව තුළ පාරවල් සහ මංමාවත් සැරසිලි කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

මෙම අතුරු ව්‍යවස්ථාව වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පොදු ස්ථාන මංමාවත් හා පාරවල් සැරසිලි කිරීම මගින් පරිසරයට සිදුවන හානි වැලැක්වීම, මහජනතාවට සිදුවන අවහිරතා වැලැක්වීම විධිමත් කිරීම, පාලනය කිරීම හා පරිපාලනය කිරීම සඳහා පනවනු ලැබේ.

02. වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව විසින් ඒ සඳහා නිකුත් කරන ලද අවසර පත්‍රයක් මත මිස කිසිම තැනැත්තෙකු විසින් ප්‍රදේශයේ කවර හෝ යම් පොදු ස්ථානයක මංමාවතක, පාරක කිසියම් ආකාරයකින් හෝ සැරසිලි කිරීම නොකළ යුතුය.

03. දෙවන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම අයදුම්පත්‍රයක් ම මෙහි අංක 1 උපලේඛනයේ දක්වා ඇති ආකෘතියට සාරානුකූලව සකස් කර ඉදිරිපත් කළ යුතුය.

04. ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් ම සැරසිලි කිරීම ආරම්භ කිරීමට අදහස් කරන දිනට යටත් පිරිසෙයින් දින 03 කට කලින් සභාපති හෝ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුව ද මෙම අතුරු ව්‍යවස්ථාවේ සඳහන් කොට ඇති කාල සීමාව ඇතුළත වුවද ඉදිරිපත් කරනු නොලැබූ එවැනි ඉල්ලුම් පත්‍රයක් විශේෂ අවස්ථානුගත කරුණු යටතේ සලකා බලා සභාපති හෝ ලේකම් විසින් ලබාගෙන ඒ සම්බන්ධයෙන් කටයුතු කළ හැකිය.

05. ඉහත කී පළමුවන උපලේඛනයෙහි ඇතුලත් ඉල්ලුම්පත්‍රයෙහි සඳහන් සියළුම විස්තර ද, ඊට අමතරව ඉල්ලුම්පත්‍රය සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා සභාපති හෝ ලේකම් විසින් ඉල්ලා සිටිනු ලබන වෙනත් යම් තොරතුරු ද ඇත්නම් ඒ සියලු විස්තර ද සෑම ඉල්ලුම්කරුවකු විසින් සැපයිය යුතුය.

06. සභාව විසින් නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් ම:

(1) මෙහි 02 වැනි උපලේඛනයේ ඇති ආකෘතියේ ප්‍රකාර විය යුතුය.

(2) එකී අවසරපත්‍රය යම් අත්හිටුවීමකට හෝ අවලංගු කිරීමට යටත්ව නිකුත් කරනු ලැබූ කාර්යය සහ කාලය සඳහා පමණක් වලංගු විය යුතුය.

(3) අවසරලාභියා විසින් කරනු ලබන සියළුම සැරසිලි අදාල මංමාවත්වල ගමන් කරනු ලබන පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක හෝ ධාවනය කරනු ලබන කවර හෝ වාහනයක ගමනා ගමනය ට බාධා වන පරිදි නොකළ යුතුය.

07. කරනු ලබන සැරසිලි කිසියම් පුද්ගලයෙකුට පුද්ගල කණ්ඩායමකට සෘජුව හෝ වක්‍රව අපහාස වන අයුරින් නොවිය යුතුය.

08. පහත සඳහන් කරුණු ගැන එනම්,

(1) නිකුත් කරනු ලබන අවසර පත්‍රය මෙම අතුරු ව්‍යවස්ථාවල සඳහන් යම් කිසි විධානයක් කඩකිරීම සඳහා යොදා ගනු නොලබන බවට,

(2) අවසර පත්‍රය මගින් අවසර ලැබුණ ක්‍රියා නිසා මිනිසාට හෝ පරිසරයට හෝ පොදු දේපලවලට අලාභ හෝ හානි හෝ යම් උපද්‍රවයක් හෝ සිදු නොවන බවට, හා

(3) පරිසරය ආරක්ෂා කිරීම සඳහා ඉල්ලුම්කරු විසින් ප්‍රමාණවත් පියවර ගෙන ඇති බවට සෑහීමකට පත්වුවහොත් පමණක් අදාල අවසර පත්‍රය නිකුත් කළ යුතුය.

09. (1) බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගාස්තු වශයෙන් සභාව විසින් කලින් කල යෝජනා සම්මුතියක් මගින් සම්මත කරගනු ලබන ගාස්තු ප්‍රමාණයක් අය කළ හැකිය.

(2) අවසර පත්‍රයක් නිකුත් කරනු ලබන අවස්ථාවේ අවසර පත්‍ර ලාභියා කරනු ලබන සැරසිලි ප්‍රමාණය පදනම් කරගෙන තැන්පත් මුදලක් සභාවේ තැන්පත් කළ යුතුය. එම තැන්පත් මුදල සභාව විසින් කලින් කලට යෝජනා සම්මුතියක් මගින් තීරණය කළ හැකිය.

10. (1) අවසරපත්‍ර ලාභියා විසින් කරනු ලැබූ සැරසිලි නියමිත කාලය තුළ ඉවත් කරනු නොලැබුවහොත් අදාල සැරසිලි සභාව විසින් ඉවත් කිරීම ද ඒ සඳහා සභාවට වැයවන මුදල ආවරණය කිරීම සඳහා අවසර පත්‍රලාභියා විසින් තැන්පත් කළ මුදල සභා අරමුදලට බැර කරනු ලැබීම ද නිත්‍යානුකූල වන්නේ ය.

(2) අවසරපත්‍රලාභියා විසින් නියමිත කාලය තුළ සැරසිලි ඉවත්කරනු ලැබීමෙන් පසු හා තැන්පත් මුදල ආපසු ලබා ගැනීම සඳහා මාස 6 ක් ඇතුලත ඉල්ලීමක් ඉදිරිපත් නොවුනහොත්, එකී තැන්පත් මුදල සභා ආදායමට බැරකළ යුතුය.

11. අවසර පත්‍රලාභියා විසින් මාර්ග දෙපස ඉඩම්වල ඇති දේපලට හෝ එම මංමාවත් වල ගමන් කරනු ලබන යම් පුද්ගලයෙකුට පුද්ගල කණ්ඩායමකට හෝ දේපලකට අවහිරවන හෝ හානිවන ආකාරයට සැරසිලි නොකළ යුතු අතර, එමගින් යම් හානියක් සිදු වුවහොත්, එම හානිය සම්බන්ධව වගකීම් අවසරපත්‍රලාභියා විසින් දැරිය යුතුය.

12. සැරසිලි කිරීමේ දී ඉවත ලන සියළුම ද්‍රව්‍ය පරිසරයට හානි නොවන ආකාරයට බැහැර කරලීම අවසරපත්‍ර ලාභියාගේ වගකීමක් වන්නේ ය.

13. සැරසිලි කිරීම සඳහා සභාව විසින් නිකුත් කරන ලද අවසර පත්‍රය සභාවේ බලයලත් නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු විසින් පරීක්ෂා කිරීම පිණිස ඉල්ලා සිටින විටකදී ඉදිරිපත් කිරීම කළයුතු වන්නේ ය.

14. අවසර පත්‍රයේ සඳහන් වන පරිදි එහි සැරසිලි ඉවත් කළයුතු දිනය හා වේලාව නොයික්මවන පරිදි සැරසිලි ඉවත් කිරීමට අවසර පත්‍රලාභියා කටයුතු කළයුතු වන්නේ ය.

15. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම පිළිබඳව ඒ උල්ලංඝනය ස්ථාපිත වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳ වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලය දෙනු ලැබූ වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිතව දැන්වීමක් බාරදෙනු ලැබීමෙන් පසු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122(2) වගන්තිය ප්‍රකාරව දඩුවමකට යටත් වේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල

"සැරසිල්ලක්" යන්නෙන් ස්වාභාවික, කෘතිම හෝ ඕනෑම ද්‍රව්‍යකින් සහ ආලෝක සංඥා මඟින් කරනු ලබන කිනම් හෝ ආකාරයක සැරසිල්ලක්, අදහස් වේ.

"තැනැත්තෙකු" යන්න යම් පුද්ගලයෙක්, පුද්ගල කණ්ඩායමක්, යම් ආයතනයක්, යම් සංවිධානයක්ද,

"පාරවල් මංමාවත් " යනුවෙන් (193 වන අධිකාරිය වන) මංමාවත් ආඥා පනතේ පිළිවෙළින් ඒවාට දී ඇති අර්ථයද,

"පොදු දේපල" යන්නෙන් අදාල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සියළුම පාරවල් හා මංමාවත් දෙපස පිහිටියා වූ දුරකථන හා විදුලි කණුද, මහජනයා පොදුවේ භාවිතා කරන සියළුම ස්ථාන දේපලද,

"පොලිස් නිළධාරියා" යන්නෙන් පොලිස් නිළ ඇඳුමෙන් සැරසුණු ශ්‍රී ලංකා පොලිස් සේවයේ නිළධාරියෙකු ද,

"බලයලත් නිළධාරියා" යන්නෙන් අදාල ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් ලියවිල්ලකින් බලය පැවරූ සභාවේ නිළධාරියෙකු ද,

"ලේකම්" යන්නෙන් ප්‍රාදේශීය සභාව සඳහා පත් කරන ලද ලේකම්වරයා ද,

"සභාව" යන්නෙන් අදාල ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද අදහස් වේ.

**පළමුවැනි උපලේඛනය**

*පාරවල් හා මංමාවත් සැරසිලි කිරීමට අවසර පත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය*

(1) අයදුම්කරුගේ නම :——————.

(2) අයදුම්කරුගේ ලිපිනය :——————.

(3) අයදුම්කරුගේ දුරකථන අංකය :——————.

(4) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :——————.

(5) සැරසිලි කරන වීථිය හෝ පෙදෙස හඳුන්වනු ලබන නාමය :— ——.

(6) සැරසිලි කිරීමට යෝජිත දිනය :————.

(7) සැරසිලි කිරීමට යොදා ගන්නා ද්‍රව්‍ය :————.

(8) සැරසිලි ඉවත් කරනු ලබන දිනය :————.

(9) අපද්‍රව්‍ය බැහැර කිරීමට යොදා ගන්නා ක්‍රියා මාර්ග :————

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

පරීක්ෂා කළෙමි. මීටර්/වර්ග මීටර් .................................. ක් සැරසිලි කිරීම සඳහා ගාස්තුව වශයෙන් රු. ................................ ක් අයකර ගැනීම නිර්දේශ කරමි.

————,
ආදායම් පරිපාලක/බලයලත් නිලධාරී.

**දෙවැනි උපලේඛනය**

*පාරවල් හා මංමාවත් සැරසිලි කිරීම සඳහා අවසර පත්‍රය*

(1) අයදුම්කරුගේ නම :————.

(2) අයදුම්කරුගේ ලිපිනය :————.

(3) අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය :————.

(4) සැරසිලි කරන වීථිය හෝ පෙදෙස :————.

(5) සැරසිලි කිරීමට යෝජිත දිනය :————.

(6) සැරසිලි ඉවත් කළයුතු දිනය :————.

ගාස්තු ගෙවන ලද දිනය : ................................ මුදල රු. : ...............................
බිල්පත් අංකය : ...........................................
කොන්දේසි හා අනුමැතිය :
.................................................................................................................
.................................................................................................................

ඉහත විස්තර හා කොන්දේසි සැලකිල්ලට ගනිමින් අදාල මාර්ගයේ සැරසිලි කිරීමට අනුමත කරමි.

| ............................ | .................................... | ........................................ |
|---|---|---|
| සකස් කළේ | පරීක්ෂා කළේ | අනුමත කළේ |

**ලැගුම් නිවාස හා නවාතැන් පලවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

වෙන්නප්පුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ එවැනි ලියාපදිංචියකින් තොරව හෝ පවත්වාගෙන යනු ලබන හෝටල්, ලැගුම් නිවාස හා නවාතැන් පලවල් විධිමත් කිරීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාව පනවනු ලැබේ.

02.(1) සභාපතිවරයා විසින් නිකුත් කරන ලද විධිමත් බලපත්‍රයක් යටතේ මිස කිසිම තැනැත්තෙකු විසින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෝටලයක් ලැගුම් නිවාසයක් හෝ නවාතැන්පලක් පවත්වාගෙන යාම නොකළ යුතුය.

(2) මෙම අතුරු ව්‍යවස්ථාවේ පළමුවැනි ඡේදය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් සඳහා සභාව විසින් *ගැසට්පත්‍රය* මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගාස්තුවක් ගෙවිය යුතුය. වලංගු කාලය සභාව විසින් කලින් අවලංගු කරන ලද්දේ නම් මිස එය නිකුත් කළ වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනයෙන් අවසන් විය යුතුය.

(3) සභාව විසින් නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මෙහි දෙවැනි උපලේඛනයේ ඇති ආකෘති ප්‍රකාර විය යුතුය.

03. ඉහත 02(1) අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයකම ලැගුම් නිවාසයක, හෝටලයක හෝ නවාතැන්පලක ඇති තනි කාමර සහ යුගල කාමර සංඛ්‍යාව වෙන් වෙන්ව සඳහන් කළ යුතු අතර, ලැගුම් නිවාසයෙහි හා නවාතැන්පලෙහි ලැගුම් පහසුකම් සලසනු ලැබිය හැකි උපරිම නවාතැන්කරුවන් සංඛ්‍යාවද සඳහන් කළ යුතුය.

04. ඉහත 02(1) අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක් ලබා ගැනීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථාවල "1" උපලේඛනයට සාරානුකූලව පිළියෙල කරන ලද අයදුම්පත්‍රයක්, ගොඩනැගිල්ලේ සැලැස්ම සමඟ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

05.(1) ලැගුම් නිවාසයක නවාතැන් ගැනීම සඳහා මෙහි අංක 6 සිට 13 දක්වා වූ අතුරු ව්‍යවස්ථාවල සඳහන් කොන්දේසිවලට අනුකූල වන්නේ නම් මිස කිසිම තැනැත්තෙකුට බලපත්‍රයක් ලබාගැනීම සඳහා හිමිකම් නොලැබේ.

(2) බලපත්‍රයක් ලබාගැනීම සඳහා වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ නම්. එයට හේතු වූ කරුණු අයදුම්පත්‍රය ලැබී සති 06 ක් තුල සභාපතිවරයා විසින් ඉල්ලුම්කරුට ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතුය.

06.(1) පරිශ්‍රය පොදු පාරකට මුහුණලා පිහිටා නොතිබේ නම් එයට පිවිසීම සඳහා සුදුසු ප්‍රවේශ මාර්ගයක් තිබිය යුතුය.

(2) ගොඩනැගිල්ල ශක්තිමත් ලෙස සාදා තිබිය යුතු අතර, යහපත් තත්වයකින් නඩත්තු කරනු ලැබිය යුතුය.

(3) වහල ස්ථිර හා කල්පවත්නා ද්‍රව්‍යවලින් තනා තිබිය යුතුය.

(4) ගොඩනැගිල්ල තුළ එකතුවන කසල දිනපතා ඉවත් කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුය.

07.(1) නවාතැන්කරුවකු සඳහා වෙන්කර ඇති කාමරයක ගෙබිමේ අවම වර්ග ප්‍රමාණය වර්ග අඩි 90 ක් විය යුතු අතර, එක් තැනැත්තෙකුට වැඩි සංඛ්‍යාවක් සඳහා නිදාගැනීමේ පහසුකම් සලසනු ලබන කාමරයක එක් තැනැත්තෙකු වෙනුවෙන් වෙන්කළ ප්‍රමාණය වර්ග අඩි 60 ට නොඅඩු විය යුතුය.

(2) සෑම කාමරයකම වාතාශ්‍රය සහ ආලෝකය ලබා ගැනීම සඳහා විවෘත කළ හැකි ජනෙල් සවිකළ යුතු වේ. ජනෙල් විවෘත කළ විට එක් එක් ජනේලයේ වර්ග ප්‍රමාණය කාමරයේ ගෙබිම් වර්ග ප්‍රමාණයෙන් 1/5 ට නොඅඩු විය යුතුය.

(3) සෑම කාමරයකම බිත්ති උසින් අඩි 10 ට නොඅඩු විය යුතුය.

(4) ගෙබිම ජලය උරානොගන්නා හා කාන්දු නොවන ද්‍රව්‍යයකින් සාදා තිබිය යුතුය.

(5) එක් එක් කාමරයේ නවාතැන් ගන්නා තැනැත්තන් සංඛ්‍යාව අනුව ප්‍රමාණවත් ඇඳන් සංඛ්‍යාවක් සහ පුටු සංඛ්‍යාවක් ද, මේසයක්, කුඩා රාක්කයක් හා කණ්නාඩියක් ද සපයා තිබිය යුතුය.

(6) සෑම ඇඳකටම මදුරු දැලක් සපයනු ලැබිය යුතුය.

# විවිධ දැන්වීම්

**කොත්මලේ ප්‍රාදේශීය සභාව - පූඩළුඔය**

වරිපනම් බද්ද පැනවීම - 2012

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තිය ප්‍රකාර 2009 වර්ෂයට ද බලපැවැත්වූ පරිදි 2012 වර්ෂය සඳහා කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල නිශ්චිත දේපල වලින් පහත සඳහන් පරිදි වාර්ෂික වටිනාකම මත වූ ප්‍රතිශතය අනුව වරිපනම් බද්දක් පනවා අයකිරීමට තීරණය කළ බවත් එම බදු පිළිවෙලින් ගාස්තු 2012 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරින් කාර්තු 04කින් අයකර ගෙවීමට තීරණය කර ඇති බවත් එම බදු මුදල් එකී කාර්තු අවසන්වීමට පෙර සභාවට ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

තවද එකී පනතේ 134(7) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් පරිදි ගෙවූ විට එහි දැක්වෙන වට්ටම් මුදල් ප්‍රදානය කරනු ලබන බවද දැනුම් දෙනු ලැබේ.

2012 ජනවාරි මස 31 වැනි දින හෝ පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු බද්ද ගෙවනු ලැබුවහොත් එම මුදලින් සියයට දහයයි (10%),

බදු මුදල කොටස් වශයෙන් ගෙවන විට බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමුවැනි මාසය තුළ ගෙවනු ලැබුවහොත් එම මුදලින් සියයට පහයි (5%)

එම්. අජිත් ධර්මකීර්ති,
සභාපති,
කොත්මලේ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 15 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | *ප්‍රදේශය* | *ප්‍රතිශතය* |
|---|---|---|
| 1. | පූඩළුඔය | 7% |
| 2. | මාවෙල | 5% |
| 3. | මාස්වෙල | 5% |
| 4. | කටුකිතුල | 5% |
| 5. | ගැරඬිඇල්ල | 5% |
| 6. | රම්බොඩ | 5% |
| 7. | කුඩාඔය | 5% |
| 8. | තවලන්තැන්න | 5% |
| 9. | කුඹල්ඔළුව | 5% |
| 10. | හපුගස්තලාව | 5% |

03-20/1

---

**කොත්මලේ ප්‍රාදේශීය සභාව - පූඩළුඔය**

වෙළඳ ව්‍යාපාර හා වෘත්තීය සම්බන්ධයෙන් බදු පැනවීම - 2012

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තිය ප්‍රකාර කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බදු උපලේඛනයේ වෙළඳ ව්‍යාපාර හා වෘත්තීන් වෙනුවෙන් 2012 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරන ලද බවත් එහි බදු මුදල් 2012 මාර්තු 31 වැනි දිනට මෙම සභාවට ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

එම්. අජිත් ධර්මකීර්ති,
සභාපති,
කොත්මලේ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 15 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය - 1 වැනි කොටස**

| *වර්ෂය සඳහා වූ ව්‍යාපාරයේ ආදායම* | *ගෙවිය යුතු වාර්ෂික බද්ද රු. ශත* |
|---|---|
| රු. 6,000ට වැඩි රු. 12,000 අඩු | 200 0 |
| රු. 12,001ට වැඩි රු. 18,750 අඩු | 300 0 |
| රු. 18,751ට වැඩි රු. 75,000ට අඩු | 500 0 |
| රු. 75,001ට වැඩි රු. 1,50,000 අඩු | 1,500 0 |
| රු. 1,50,000 ට වැඩි | 3,000 0 |

***උපලේඛනය - 11 වැනි කොටස***

මෙම බදු මුදල අදාළ වන ව්‍යාපාර පහත දැක්වේ :-

1. කොමිස් ඒජන්තවරු
2. වෙන්දේසිකරුවෝ
3. බ්‍රෝකර්වරු
4. මුදල් ණයට දෙන්නන්
5. මුදල් ආයෝජකයින්
6. කොන්ත්‍රාත්කරුවන්
7. උකස් බඩු ගන්නවුන්
8. පෞද්ගලික අධ්‍යාපන පන්ති පවත්වන්නන්
9. ගණන් පරීක්ෂකවරුන්
10. ගෘහ නිර්මාණ ශිල්පීන්
11. සැපයුම්කරුවන්
12. රක්ෂණ නියෝජිතයන්
13. කුළී කාර් හා වෑන් අයිතිකරුවන්
14. මෝටර් රථ වෙළඳාම් කරන්නන්
15. බැංකු හා රක්ෂණ සමාගම්
16. රියදුරු පුහුණු ආයතන
17. ඇඟළුම් කර්මාන්ත ශාලා
18. පරිගණක පුහුණු මධ්‍යස්ථාන පවත්වන්නන්
19. උපදේශක සේවාවන් පවත්වාගෙන යාම
20. මෝටර් බයිසිකල් වෙළඳාම් කරන්නන්
21. ආහාර සපයන්නෙකුගේ ව්‍යාපාරයක්
22. සම්ප්‍රේෂණ කුළුණු
23. ප්‍රවාහන නියෝජිතයින්
24. දුරකථන කුටි

03-20/7

---

**කොත්මලේ ප්‍රාදේශීය සභාව - පූඩළුඔය**

සාතක මඩු ගාස්තු - 2012

1987 අංක 06 දරන පළාත් පාලන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනතේ 02 වැනි වගන්තිය යටතේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් සම්පාදිත

1998.08.23 වැනි දින අංක 520/7 ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල 32 වැනි ඡේදයේ 15 වැනි වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර 2012 වර්ෂයේ සිට නැවත සංශෝධනය කරන තෙක් පහත සඳහන් උපලේඛනය පරිදි ඝාතන මඩු ගාස්තු අයකිරීමට කොත්මලේ ප්‍රාදේශීය සභාව තීරණය කර ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. අජිත් ධර්මකීර්ති,
සභාපති,
කොත්මලේ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 15 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | රු. ශ. |
|---|---|---|
| 1. | ගවයෙකු ඝාතනය සඳහා අවසර පත්‍ර ගාස්තුව සහ ප්‍රදර්ශනය සඳහා ගාස්තු | 200 0 |
| 2. | ගවයෙකු සඳහා හදිසි ඝාතන අවසර පත්‍ර ගාස්තු | 2,000 0 |
| 3. | බැටළුවෙකු හෝ එළුවෙකු ඝාතනය කිරීම සහ ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු | 50 0 |
| 4. | බැටළුවෙකු හෝ එළුවෙකු හදිසි ඝාතන සහ ප්‍රදර්ශන මඩු ගාස්තු | 200 0 |
| 5. | ගවයෙකුගේ මළකඳ සහ බොකු ප්‍රවාහනය කිරීමේ ගාස්තු | 50 0 |
| 6. | බැටළුවෙකු හෝ එළුවෙකු හෝ ඌරෙකුගේ මළකඳ සහ බොකු වෙළඳපොලෙන් පිටතට ප්‍රවාහනය කිරීමේ ගාස්තු | 50 0 |
| 7. | බැටළුවෙකු හෝ එළුවෙකු හෝ ඌරෙකුගේ මළකඳ සහ බොකු ප්‍රවාහනය කිරීමේ ගාස්තු | 100 0 |

03-20/6

---

**කොත්මලේ ප්‍රාදේශීය සභාව - පූඩළුඔය**

රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද - 2012

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 148 වැනි වගන්තිය ප්‍රකාර කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර 2012 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරන ලද බවත්, එහි බලපත්‍ර ගාස්තු 2012 මාර්තු 31 දිනට මෙම සභාවට ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

එම්. අජිත් ධර්මකීර්ති,
සභාපති,
කොත්මලේ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 15 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය සභාවේ ප්‍රධාන කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | *රු. ශත* |
|---|---|---|
| 01. | මෝටර් රථයක්, මෝටර් සයිකලයක්, මෝටර් ට්‍රයිසිකලයක් , කරත්තයක් හෝ ජින් රික්ෂෝවක් බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 30 0 |
| 02. | සෑම බයිසිකලයක් හෝ බයිසිකල්කාරයක් හෝ කරත්තයක් සඳහා | |
| | *(අ)* වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 30 0 |
| | *(ආ)* වෙළඳ කාර්යයක් නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | 20 0 |
| 03. | සෑම කරත්තයක් සඳහා | 25 0 |
| 05. | සෑම රික්ෂෝවක් සඳහා | 10 0 |
| 05. | සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටලුවෙකු සඳහා | 20 0 |
| 06. | සෑම ඇතෙකු සඳහා | 50 0 |
| 07. | ත්‍රිරෝද රථයක් සඳහා | 250 0 |

03-20/5

---

**කොත්මලේ ප්‍රාදේශීය සභාව - පූඩළුඔය**

අක්කර බදු පැනවීම -2012

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (37) වැනි වගන්තිය ප්‍රකාර කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටියාවූ ද ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ ද ඉඩම් වලින් එම ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 01ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක පහත උපලේඛනයේ දක්වා

ඇති පරිදි වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර 2012 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරන ලද බවත්, එහි බලපත්‍ර ගාස්තු 2012 මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරින් කාර්තු 04කින් අයකර ගැනීමට තීරණය කර ඇති බවත්, එම බදු මුදල් එකී කාර්තු අවසන් වීමට පෙර සභාවට ගෙවිය යුතු බවත්, නිවේදනය කරනු ලැබේ.

එම්. අජිත් ධර්මකීර්ති,
සභාපති,
කොත්මලේ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 15 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය සභාවේ,
ප්‍රධාන කාර්යාලයේ දී ය.

*උපලේඛනය*

| | | රු. ශත |
|---|---|---|
| (1) | හෙක්ටයාර් 01කට වැඩි නමුත් හෙක්ටයාර් 05කට නොවැඩි අවස්ථාවක | 50 0 |
| (2) | හෙක්ටයාර් 05ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක හෙක්ටයාර් 01කට | 10 0 |

03-20/2

---

**කොත්මලේ ප්‍රාදේශීය සභාව-පූඩළුඔය**

වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම -2012

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තිය ප්‍රකාර කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි වාර්ෂික වටිනාකම මත පදනම් වූ ඇතැම් වෙළඳාම් සම්බන්ධ බදු 2012 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරන ලද බවත්, ඇතැම් වෙළඳාම් සම්බන්ධ බදු ගාස්තු 2012 මාර්තු මස 31 වැනි දිනට මෙම සභාවට ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

එම්. අජිත් ධර්මකීර්ති,
සභාපති,
කොත්මලේ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 15 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය සභාවේ,
ප්‍රධාන කාර්යාලයේ දී ය.

*උපලේඛනය II අන්තරාදායක හා අප්‍රසන්න නොවන ව්‍යාපාර*

| *අංකය* | *ව්‍යාපාරයේ ස්වභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* | *වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන අවස්ථාවක* |
|---|---|---|---|---|
| | | *රු. ශ.* | *රු. ශ.* | *රු. ශ.* |
| 01. | රෙදිපිළි විකිණීමේ ස්ථානයක් | 700 0 | 850 0 | 1,000 0 |
| 02. | පිඟන් වීදුරු බඩු විකිණීමේ ස්ථානයක් | 800 0 | 800 0 | 1,000 0 |
| 03. | පාවහන් වෙළඳ ස්ථානයක් | 850 0 | 900 0 | 1,000 0 |
| 04. | පොත්පත් ලිපිද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 05. | ඉංග්‍රීසි බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් | 900 0 | 950 0 | 1,000 0 |
| 06. | දේශීය බෙහෙත් ද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් | 700 0 | 900 0 | 1,000 0 |
| 07. | ගුවන් විදුලි යන්ත්‍ර රූපවාහිනී යන්ත්‍ර මහන මැෂින් ආදිය විකිණීමේ ස්ථානයක් | 750 0 | 900 0 | 1,000 0 |
| 08. | මල් වෙළඳසැලක් | 500 0 | 700 0 | 1,000 0 |
| 09. | විසිතුරු බඩු සාප්පු බඩු සුවඳ විලවුන් ආදිය විකිණීමේ ස්ථානයක් | 700 0 | 800 0 | 1,000 0 |
| 10. | මෝටර් රථ අමතර කොටස් වෙළඳසැලක් | 600 0 | 800 0 | 1,000 0 |
| 11. | ඉංග්‍රීසි බෙහෙත් ශාලාවක් | 900 0 | 950 0 | 1,000 0 |
| 12. | දේශීය බෙහෙත් ශාලාවක් | 600 0 | 800 0 | 1,000 0 |
| 13. | දත් බඳින ස්ථානයක් | 900 0 | 950 0 | 1,000 0 |
| 14. | ඇස්කණ්නාඩි වෙළඳ සැලක් | 800 0 | 900 0 | 1,000 0 |

| අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 15. | රෙකෝඩ්බාර් එකක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 800 0 |
| 16. | වීඩියෝ චිත්‍රපටි අලෙවි කිරීම හෝ කුලියට දීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 17. | ඇඳුම් මැසීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 18. | පාපැදි හා පාපැදි අමතර කොටස් වෙළඳසැලක් | 500 0 | 750 0 | 900 0 |
| 19. | ගෘහ භාණ්ඩ වෙළඳසැලක් | 750 0 | 850 0 | 1,000 0 |
| 20. | ටින් කෑම (කිරිපිටි) හා බිස්කට් විකිණීමේ ස්ථානයක් (ග්‍රොසරියක්) | 700 0 | 800 0 | 1,000 0 |
| 21. | මල්පැල වෙළඳසැලක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 22. | ඡායාරූප ශාලාවක් | 750 0 | 850 0 | 1,000 0 |
| 23. | ඔර්ලෝසු අලුත්වැඩියා කරන ස්ථානයක් හෝ විකුණනු ලබන ස්ථානයක් | 500 0 | 700 0 | 900 0 |
| 24. | පුවත්පත් බෙදා හරින ස්ථානයක් | 800 0 | 900 0 | 1,000 0 |
| 25. | ලිපි හෝ ඡායාරූප හෝ රෝනියෝ පිටපත් ගැනීමේ ස්ථානයක් | 500 0 | 600 0 | 700 0 |
| 26. | යකඩ බඩු කඩයක් | 750 0 | 850 0 | 1,000 0 |
| 27. | රූපලාවන්‍ය මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 28. | ටයර් ටියුබ් වෙළඳසැලක් | 800 0 | 900 0 | 1,000 0 |
| 29. | මැටි භාණ්ඩ නිෂ්පාදනය හෝ විකුණනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 900 0 |
| 30. | වීදුරු භාණ්ඩ හෝ විකුණනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 700 0 |
| 31. | පිත්තල භාණ්ඩ නිෂ්පාදනය හෝ විකුණනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 32. | පින්තූර රාමු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 600 0 | 1,000 0 |
| 33. | දුරකථන ඇමතුම් ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 34. | විදේශ රැකියා ඒජන්සියක් | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | ඒජන්සි තැපැල් කාර්යාලයක් | 600 0 | 800 0 | 1,000 0 |
| 36. | ලොතරැයි අලෙවි සැලක් | 750 0 | 850 0 | 1,000 0 |
| 37. | විදුලි උපකරණ විකිණීම | 900 0 | 950 0 | 1,000 0 |
| 38. | පරිගණක හෝ පරිගණක අමතර කොටස් වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 39. | තරග ඔට්ටු භාරගැනීමේ ස්ථානයක් | 600 0 | 850 0 | 1,000 0 |
| 40. | පරිගණක ආශ්‍රිත සේවා සැපයීමේ ස්ථානයක් | 900 0 | 950 0 | 1,000 0 |
| 41. | රැහැන් රූපවාහිනී සේවා සැපයීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 42. | අත්කම් භාණ්ඩ නිෂ්පාදනය සහ වෙළඳාම | 400 0 | 500 0 | 600 0 |
| 43. | ප්‍රතිමා මූර්ති සහ භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවිය | 750 0 | 850 0 | 1,000 0 |
| 44. | දුරකථන සහ දුරකථන අමතර කොටස් අලෙවිය | 700 0 | 900 0 | 1,000 0 |
| 45. | විසිතුරු මසුන් වෙළඳාම | 400 0 | 500 0 | 600 0 |
| 46. | උත්සව භාණ්ඩ කුලියට සැපයීමේ ස්ථානයක් | 800 0 | 900 0 | 1,000 0 |
| 47. | ජංගම වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 48. | පූජා භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවිය | 500 0 | 700 0 | 1,000 0 |
| 49. | ජංගම දුරකථන අලුත්වැඩියාව සහ වෙළඳාම | 750 0 | 850 0 | 1,000 0 |
| 50. | සිම් කාඩ්පත් අලෙවි කරනු ලබන ස්ථානයක් | 700 0 | 800 0 | 1,000 0 |
| 51. | ශරීර සුවතා මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 650 0 | 750 0 |
| 52. | කුෂන් වැඩ කරනු ලබන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 53. | තෙල් බෙහෙත් වර්ග ඇසුරුම් කිරීම හා වෙළඳාම | 500 0 | 600 0 | 800 0 |
| 54. | රටබීම හලක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 55. | කපු හෝ වෙනත් කෙඳි වර්ගවලින් භාණ්ඩ නිෂ්පාදනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 600 0 | 750 0 | 1,000 0 |
| 56. | කපු පුලුන් ගබඩා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 57. | ගුවන් විදුලි රූපවාහිනී යන්ත්‍ර අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 58. | හඳුන්කූරු නිෂ්පාදනය | 400 0 | 600 0 | 800 0 |
| 59. | ලෝහමය සුන්බුන් ගබඩා කිරීමේ ස්ථානයක් | 600 0 | 800 0 | 1,000 0 |
| 60. | කොන්ක්‍රීට් හෝ වැහි පයිප්ප හෝ භාණ්ඩ නිෂ්පාදන ගබඩා කර තැබීමේ ස්ථානයක් | 600 0 | 800 0 | 1,000 0 |
| 61. | සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් | 800 0 | 900 0 | 1,000 0 |
| 62. | දැව ගබඩාවක් | 800 0 | 900 0 | 1,000 0 |
| 63. | ස්වර්ණාභරණ නිපදවීමේ හෝ අලුත්වැඩියා කරන ස්ථානයක් | 600 0 | 800 0 | 1,000 0 |

| අංකය | ව්‍යාපාරයේ ස්වභාවය | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| | | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| 64. | රස කැවිලි නිපදවීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 65. | සබන් නිෂ්පාදනය කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 66. | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 900 0 | 1,000 0 |
| 67. | පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 1,000 0 |
| 68. | ශබ්ද විකාශන යන්ත්‍ර කුළියට දීමේ ස්ථානයක් | 500 0 | 800 0 | 1,000 0 |
| 69. | එළවළු පළතුරු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 1,000 0 |
| 70. | සරුවත් හෝ සිසිල් බීම වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 800 0 | 1,000 0 |
| 71. | අයිස්ක්‍රීම් නිපදවීමේ හෝ විකිණීමේ ස්ථානයක් | 500 0 | 800 0 | 1,000 0 |
| 72. | තේ කුඩු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 800 0 | 1,000 0 |
| 73. | බුලත් පුවක් වෙළඳාම සඳහා | 500 0 | 700 0 | 800 0 |
| 74. | කුළු බඩු පැකට් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 1,000 0 |
| 75. | පැණි ගබඩා කිරීම හා විකුණනු ලබන ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 600 0 | 800 0 | 1,000 0 |
| 76. | අමු තේ දළු එකතු කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 900 0 | 1,000 0 |
| 77. | බිම්මල් වගාව | 750 0 | 900 0 | 1,000 0 |
| 78. | සෙල්ලම් බඩු නිපදවීම හෝ වෙළඳාම | 900 0 | 950 0 | 1,000 0 |
| 79. | රෙදි මහන නූල් ගබඩා කිරීම හා වෙළඳාම | 500 0 | 700 0 | 1,000 0 |
| 80. | කෘෂිකාර්මික ගොවිපොලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 81. | වැනිලා නිෂ්පාදනය කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 82. | මීපැණි නිෂ්පාදනය හා වෙළඳාම | 300 0 | 500 0 | 800 0 |
| 83. | උත්සව සඳහා ආහාරපාන සැපයීම | 500 0 | 750 0 | 1,000 0 |
| 84. | විකිණීම සඳහා තොග වශයෙන් හෝ 15ට වැඩි ප්‍රමාණයක් පිටි හාල් ලූනු හෝ සීනි ගබඩා කර ගැනීම | 500 0 | 750 0 | 1,000 0 |
| 85. | සුළු අපනයන භෝග පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 86. | බයිට්ස් වර්ග (කට ගැස්ම වර්ග) නිපදවීම | 700 0 | 850 0 | 1,000 0 |
| 87. | බේකරි කෑම විකිණීම | 900 0 | 950 0 | 1,000 0 |
| 88. | විසිතුරු මසුන් වෙළඳාම | 500 0 | 750 0 | 1,000 0 |
| 89. | ජනමාධ්‍ය වැඩ සටහන් නිර්මානය කිරීමේ ස්ථානයක් පතත්වාගෙන යාම | 750 0 | 900 0 | 1,000 0 |
| 90. | වාහන ආනයනය හා විකිණීම | 750 0 | 900 0 | 1,000 0 |
| 91. | අධ්‍යාපන පුහුණුව | 500 0 | 600 0 | 750 0 |
| 92. | ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය හා ගොඩනැගිලි ඉදිකිරීම | | | 3,000 0 |

03-20/4

---

**කොත්මලේ ප්‍රාදේශීය සභාව - පූඩළුඔය**

වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම - 2012

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය ප්‍රකාර කොත්මලේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි වාර්ෂික වටිනාකම මත පදනම් වූ වාර්ෂික බලපත්‍ර ගාස්තුවක් 2012 වර්ෂය සඳහා පනවා අයකිරීමට තීරණය කරන ලද බවත් එහි බලපත්‍ර ගාස්තු 2012 මාර්තු 31 වැනි දිනට මෙම සභාවට ගෙවිය යුතු බවත් නිවේදනය කරනු ලැබේ.

එම්. අජිත් ධර්මකීර්ති,
සභාපති,
කොත්මලේ ප්‍රාදේශීය සභාව.

2011 අගෝස්තු මස 15 වැනි දින,
කොත්මලේ ප්‍රාදේශීය සභාවේ,
ප්‍රධාන කාර්යාලයේ දී ය.

*බලපත්‍ර*

*උපලේඛනය I අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර*

| *අංකය* | *ව්‍යාපාරයේ ස්වාභාවය* | *වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක* <br> *රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 751 ඉක්මවන එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක* <br> *රු. ශත* | *වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන අවස්ථාවක* <br> *රු. ශත* |
|---|---|---|---|---|
| 01. | ගඩොල්, උළු ගබඩා කිරීමේ මධ්‍යස්ථානයක් | 700 0 | 900 0 | 1,000 0 |
| 02. | අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩා කර තැබීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 03. | බිත්තර හෝ මස් පිණිස කුකුළන් ඇති කරන ගොවි පොළවල් | | | |
| (1) | කුකුළන් 23-50 දක්වා | 300 0 | 400 0 | 500 0 |
| (2) | කුකුළන් 51-100 දක්වා | 350 0 | 450 0 | 550 0 |
| (3) | කුකුළන් 101ට වැඩි | 700 0 | 900 0 | 1,000 0 |
| 04. | බැටළුවන් ඌරන් හෝ එළුවන් ඇති කරන ස්ථානයක් | 750 0 | 850 0 | 1,000 0 |
| 05. | මෝටර් රථවාහන හෝ ලොරි බොඩි නිපදවීමේ ස්ථානයක් | 600 0 | 750 0 | 1,000 0 |
| 06. | යතුරු පැදි අළුත්වැඩියා කරන ස්ථානයක් | 800 0 | 900 0 | 1,000 0 |
| 07. | පිඟන් ගඩොල් වෙළඳාම | 900 0 | 950 0 | 1,000 0 |
| 08. | ත්‍රිරෝද රථ අළුත්වැඩියාව | 750 0 | 850 0 | 1,000 0 |
| 09. | ත්‍රිරෝද රථ අමතර කොටස් වෙළඳාම | 700 0 | 800 0 | 1,000 0 |
| 10. | බයිසිකල් අළුත්වැඩියා කරන ස්ථානයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 11. | ටයර් හා ටියුබ් වෝල්කනයිස් කරන ස්ථානයක් | 700 0 | 850 0 | 1,000 0 |
| 12. | මෝටර් රථවාහන අළුත්වැඩියා කරන ස්ථානයක් | 800 0 | 900 0 | 1,000 0 |
| 13. | ටයර් නැවත පිරවීමේ ස්ථානයක් | 600 0 | 850 0 | 1,000 0 |
| 14. | විද්‍යුත් ලෝහ ආලේපනය කරන ස්ථානයක් | 600 0 | 800 0 | 1,000 0 |
| 15. | බැටරි චාජ් කිරීමේ ස්ථානයක් හෝ අළුත්වැඩියා කරන ස්ථානයක් | 600 0 | 700 0 | 800 0 |
| 16. | මෝටර් වාහන සේවා ස්ථානයක් | 700 0 | 950 0 | 1,000 0 |
| 17. | වැල්ඩිං වැඩ පොළක් | 700 0 | 850 0 | 1,000 0 |
| 18. | වඩු කර්මාන්ත ශාලාවක් | 500 0 | 700 0 | 1,000 0 |
| 19. | යන්ත්‍රානුසාරයෙන් ලී ඉරන මෝලක් | 800 0 | 900 0 | 1,000 0 |
| 20. | ගෘහ භාණ්ඩ නිෂ්පාදනය කරන හෝ ගබඩා කිරීමේ ස්ථානයක් | 700 0 | 800 0 | 1,000 0 |
| 21. | දර මඩුවක් | 500 0 | 700 0 | 1,000 0 |
| 22. | බාබර් සාප්පුවක් හෝ කොණ්ඩා සකස් කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 23. | බ්ලොක් ගල් වැඩපොළක් | 500 0 | 700 0 | 800 0 |
| 24. | වාත්තු වැඩපලක් | 500 0 | 700 0 | 850 0 |
| 25. | ඇළුමිනියම් භාණ්ඩ නිපදවීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 26. | ගිනිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා ගබඩා කිරීමේ ස්ථානයක් | 800 0 | 900 0 | 1,000 0 |
| 27. | පින්තාරු වාර්නිස් ඩිස්ටෙම්පර් හෝ ගබඩා කරන ස්ථානයක් | 600 0 | 700 0 | 1,000 0 |
| 28. | පොහොර හෝ රසායනික ද්‍රව්‍ය ගබඩා කරන ස්ථානයක් | 800 0 | 900 0 | 1,000 0 |
| 29. | පෙට්‍රල් ඩීසල් හෝ වෙනත් ඛණිජ තෙල් ගබඩා කරන ස්ථානයක් | 750 0 | 850 0 | 1,000 0 |
| 30. | ශීතකරන අළුත්වැඩියා කරන ස්ථානයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 31. | විදුලි කාර්මික වැඩ පොළක් | 300 0 | 700 0 | 1,000 0 |
| 32. | පුවක් සකස් කරන ස්ථානයක් | 400 0 | 600 0 | 800 0 |
| 33. | කරවල ලුණු මාළු ගබඩා කරන ස්ථානයක් | 400 0 | 500 0 | 750 0 |
| 34. | විකිණීම සඳහා ශීතකල කුකුල් මස් හෝ මාළු ගබඩා කරන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 35. | සත්ව ආහාර ගබඩා කරන ස්ථානයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 36. | සබන් නිෂ්පාදනය කරන ස්ථානයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 37. | හෝටලයක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 900 0 | 1,000 0 |
| 38. | බේකරියක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 900 0 | 1,000 0 |
| 39. | නවාතැන්පලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම සඳහා | 400 0 | 600 0 | 800 0 |
| 41. | වී කෙටීමේ ස්ථානයක් හෝ ධාන්‍ය ඇඹරුම්හලක් පවත්වාගෙන යාම සඳහා | 600 0 | 800 0 | 1,000 0 |
| 42. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 850 0 | 1,000 0 |
| 43. | හිස් බෝතල් පරණ කඩදාසි ආදිය ගබඩා කරන ස්ථානයක් | 500 0 | 800 0 | 1,000 0 |
| 44. | සිනමා ශාලාවක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 900 0 | 1,000 0 |
| 45. | පපඩම් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් | 400 0 | 500 0 | 1,000 0 |

| අංකය | ව්‍යාපාරයේ ස්වාභාවය | වාර්ෂික වටිනාකම රු. 750 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු. 751 එහෙත් රු. 1,500 නොඉක්මවන අවස්ථාවක | වාර්ෂික වටිනාකම රු. 1,501 ඉක්මවන අවස්ථාවක |
|---|---|---|---|---|
| 46. | ගැලුම් 25ට වැඩි පොල් තෙල් ගබඩා කිරීමේ ස්ථානයක් | 300 0 | 500 0 | 1,000 0 |
| 47. | විසිතුරු පින්තාරු (ස්ප්‍රේ) පවත්වාගෙන යන ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 48. | සිමෙන්ති ගබඩා කරන ස්ථානයක් | 600 0 | 800 0 | 1,000 0 |
| 49. | විනාකිරි ගබඩා කිරීමේ හෝ නිපදවීමේ ස්ථානයක් | 300 0 | 500 0 | 800 0 |
| 50. | ඩ්‍රයික්ලීන් කිරීමේ හෝ ලොන්ඩරියක් පවත්වාගෙන යාම | 500 0 | 700 0 | 900 0 |
| 51. | සිල්ලර හෝ කුළු බඩු කඩයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 52. | සුරුට්ටු හෝ බීඩි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 600 0 | 800 0 | 1,000 0 |
| 53. | යකඩ වැඩ කරන කම්හලක් | 600 0 | 800 0 | 1,000 0 |
| 54. | තේ කොල පැකට් කරන ස්ථානයක් | 500 0 | 700 0 | 1,000 0 |
| 55. | කළුගල් පිපිරවීමේ හෝ කළුගල් කැඩීමේ ස්ථානයක් | 800 0 | 900 0 | 1,000 0 |
| 56. | බලවේග පේෂකර්ම ස්ථානයක් | 800 0 | 900 0 | 1,000 0 |
| 57. | අත්යන්ත්‍ර පේෂකර්ම ස්ථානයක් | 700 0 | 800 0 | 900 0 |
| 58. | ප්ලාස්ටික් නාමපුවරු සකස් කරන ස්ථානයක් | 750 0 | 900 0 | 1,000 0 |
| 59. | මිරිස් ඇඹරීමේ ස්ථානයක් | 750 0 | 900 0 | 1,000 0 |
| 60. | දුම්කොල ගබඩා කරන ස්ථානයක් | 400 0 | 600 0 | 800 0 |
| 61. | කිරි පට්ටියක් පවත්වාගෙන යාම | | | |
| | (1) දෙනුන් 05ක් හෝ 06කට අඩු | 150 0 | 250 0 | 300 0 |
| | (2) දෙනුන් 06 සිට 10 දක්වා | 300 0 | 350 0 | 400 0 |
| | (3) දෙනුන් 10ක් හෝ ඊට වැඩි | 400 0 | 500 0 | 750 0 |
| 62. | මාළු වෙළඳසැලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 63. | ගවමස් වෙළඳසැලක් සඳහා | 500 0 | 750 0 | 1,000 0 |
| 64. | ගවමස් හැර වෙනත් මස් වෙළඳසැලක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 65. | ව්‍යාපාරික වශයෙන් හකුරු හෝ පැණි නිපදවීමේ ස්ථානයක් | 500 0 | 800 0 | 1,000 0 |
| 66. | තේ කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම | 525 0 | 800 0 | 1,000 0 |
| 67. | මිනී පෙට්ටි සාප්පුවක් පවත්වාගෙන යාම සඳහා | 600 0 | 800 0 | 1,000 0 |
| 68. | යාන්ත්‍රික වඩු මඩුවක් පවත්වාගෙන යාම සඳහා | 750 0 | 900 0 | 1,000 0 |
| 69. | ඉටිපන්දම් නිෂ්පාදනය කරන ස්ථානයක් | 900 0 | 950 0 | 1,000 0 |
| 70. | රස කැවිලි නිපදවීම හා අලෙවි කිරීම | 800 0 | 900 0 | 900 0 |
| 71. | කුළු බඩු පැකට් කිරීම හා අලෙවි කිරීම | 500 0 | 800 0 | 1,000 0 |
| 72. | ඇඹරුම් හා ධාන්‍ය වර්ග පැකට් කිරීම හා අලෙවි කිරීම | 500 0 | 750 0 | 1,000 0 |
| 73. | නූඩ්ල්ස් නිපදවීම | 500 0 | 750 0 | 1,000 0 |
| 74. | යෝගට් නිෂ්පාදනය කිරීම හා වෙළඳාම | 750 0 | 900 0 | 1,000 0 |
| 75. | පීවීසී ජලනල හා අමතර කොටස් නිෂ්පාදනය කිරීම | 800 0 | 900 0 | 1,000 0 |
| 76. | කිරි ශීත කිරීම/එකතු කිරීමේ මධ්‍යස්ථානයක් හෝ කිරි වෙළඳාම | 800 0 | 900 0 | 1,000 0 |
| 77. | ඇගැළුම් 600ට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් වෙළඳාම | 750 0 | 900 0 | 1,000 0 |
| 78. | කරවල ලුනු මාළු හෝ ජාඩි හොණ්ඩර 03ට වැඩි | 400 0 | 600 0 | 900 0 |
| 79. | හොණ්ඩර 03ට වැඩියෙන් තේ ගබඩාවක් තබා ගැනීම | 700 0 | 850 0 | 1,000 0 |
| 80. | රා තැබැරුමක් පවත්වාගෙන යාම සඳහා | 800 0 | 900 0 | 1,000 0 |
| 81. | ජංගම ශීතකල මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම සඳහා | 900 0 | 950 0 | 1,000 0 |
| 82. | පැතලි වීදුරු ගබඩා කිරීම හෝ විකිණීමේ ස්ථානයක් | 500 0 | 750 0 | 1,000 0 |
| 83. | ගෝඝාතකාගාරයක් පවත්වාගෙන යාම | 800 0 | 900 0 | 1,000 0 |
| 84. | වැලි ආශ්‍රිත ඛණිජ ද්‍රව්‍ය ගොඩ දැමීම | 800 0 | 900 0 | 1,000 0 |
| 85. | ජංගම යාන්ත්‍රික දැව ඉරුම් යන්ත්‍ර මගින් දැව කැපීම | 800 0 | 900 0 | 1,000 0 |
| 86. | කිරි වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා | 500 0 | 600 0 | 900 0 |
| 87. | එල්. පී. ගෑස් අලෙවි සැලක් | 600 0 | 850 0 | 1,000 0 |

03-20/3

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

**(ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)**

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

*(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය.)*

*** තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | *පිටපතක මිළ* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2012** | | | |
| මාර්තු | 2012.03.02 | සිකුරාදා | 2012.02.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.09 | සිකුරාදා | 2012.02.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.16 | සිකුරාදා | 2012.03.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.23 | සිකුරාදා | 2012.03.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.03.30 | සිකුරාදා | 2012.03.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අප්‍රේල් | 2012.04.05 | බ්‍රහස්පතින්දා | 2012.03.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.04.11 | බදාදා | 2012.03.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.04.20 | සිකුරාදා | 2012.04.05 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2012.04.27 | සිකුරාදා | 2012.04.11 | බදාදා | දහවල් | 12.00 |
| මැයි | 2012.05.04 | සිකුරාදා | 2012.04.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.11 | සිකුරාදා | 2012.04.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.18 | සිකුරාදා | 2012.05.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2012.05.25 | සිකුරාදා | 2012.05.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

F 5 – B 80374 (S/E)